# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,372 - 2024 පෙබරවාරි මස 16 වැනි සිකුරාදා - 2024.02.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 412 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 414 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 422 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 424 |


*සැ. යු.-* (i) අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2024 පෙබරවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත 2024 පෙබරවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2024 පෙබරවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 මාර්තු මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට්* පත්‍රයේ දැන්වීම් 2024 පෙබරවාරි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට්* පත්‍රය *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

411 - B 82541 - 5,403 (2024/02)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු ආරාධනය

IPW/ මාදම්පේ සහ/ IPW මුන්ඩල් අංශ සඳහා SUIT EN 45 E1 රේල්පීලිවලට ගැළපෙන LESS HIGH CONCRETE SLEEPERS 4000 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය

***ශ්‍රී ලංකා දුම්රිය සේවය* - *IFB No.* - *SRS F. 7896***

1. ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් IPW/ මාදම්පේ/ IPW මුන්ඩල් අංශ සඳහා SUIT EN 45 E1 රේල්පීලිවලට ගැළපෙන LESS HIGH CONCRETE SLEEPERS 4000 ක් සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයන්/සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

2. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය (NCB) අනුව සිදු කෙරෙනු ඇත.

3. උනන්දුවක් දක්වන යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ට **2024.02.06 සිට 2024.02.28 දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා වැඩ කරන දිනයන්හි දී පහත දක්වා ඇති ලිපිනයෙන් වැඩිදුර තොරතුරු ලබා ගැනීමට සහ ලංසු ලේඛන පරීක්ෂා කිරීමට හැකිය.

   නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන),
   දුම්රිය මාර්ගය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,
   ඕල්කොට් මාවත, කොළඹ 10,
   ශ්‍රී ලංකාව.

   දුරකතන අංකය : +94(11) 2438078 හෝ +94(11) 2436818
   ෆැක්ස් අංකය : +94(11) 2432044
   ඊමේල් : srs.slr@gmail.com,
   වෙබ් අඩවිය : www.railway.gov.lk

4. ලංසුකරුවා ශ්‍රී ලංකා දුම්රිය සේවයට Concrete Sleepers 5000 කට වැඩි ගණනක් සපයා තිබිය යුතුය. *නැතහොත්* රු. මිලියන 50 කට වැඩි වටිනාකමින් යුත් පෙරැදි කොන්ක්‍රීට් බීම් සපයා තිබිය යුතුය. එසේ *නැතහොත්* පසුගිය වසර පහක (5) කාලය තුළ රු. මිලියන 500 කට නොඅඩු අගයකින් යුතු කොන්ක්‍රීට් කණු සපයා තිබිය යුතුය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.02.06 සිට 2024.02.28 දක්වා ප.ව. 3.00** තෙක් නැවත ගෙවනු නොලබන **රු. 28,250/-** ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා ලිඛිත අයදුම්පත්‍රයක් දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය, ඕල්කොට් මාවත, කොළඹ 10 යන ලිපිනයට යොමු කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය.

6. සෑම ලංසුවක් ම ලංසු ආරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණ මුදල රු. **1,550,000.00** ක් විය යුතු අතර, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.

7. **2024.02.29 දින ප.ව. 02.00**ට හෝ එදිනට පෙර පහත ලිපිනයට ලංසු එවිය යුතු අතර, ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. මෙම ලංසු විවෘත කිරීමේ දී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

02 - 560

## ඉඩම් අමාත්‍යාංශය

### මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුළියට ගැනීම සඳහා මිල ගණන් කැඳවීමයි - 2024**

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුළියට ගැනීමට මිල ගණන් **2024.03.07 දින පස්වරු 2.00** දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. එදින ම ප.ව. **2.05**ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාර ගන්නා ස්ථානය* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| බස්නාහිර පළාත | කොළඹ | හෝමාගම | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, කොළඹ 05 | හෝමාගම නගරය අවට | 2024.03.31 |

***සපුරාලිය යුතු පොදු අවශ්‍යතා :***

සෑම ගොඩනැගිල්ලක් ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්‍ෂා වී තිබිය යුතුය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතුය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතුය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්ත ශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතුය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතුය. අවම වශයෙන් වාහන තුනක් නවතා තැබීමට පහසුකම් හා ගරාජ පහසුකම් තිබිය යුතුය. මායිම් ගල් සකස් කිරීම සඳහා ඉඩ පහසුකම් තිබිය යුතු අතර, නිලධාරීන් දහදෙනෙකුට ප්‍රමාණවත් කාමර හෝ ඉඩ පහසුකම් ද තිබිය යුතුය. ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය අවම වශයෙන් වර්ග අඩි 2300 පමණ හෝ ඊට වැඩි විය යුතුය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද සහිතව, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙ හි "ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුළියට ගැනීම (අදාළ ස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, **2024.03.07 දින පස්වරු 2.00**ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

ඩබ්ලිව්. සුදත් එල්. සී. පෙරේරා,
සර්වේයර් ජනරාල්,
කොළඹ 05, කිරුළ පාර, සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.
2024 පෙබරවාරි මස 07 දින.

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුළියට ගැනීම සඳහා මිල ගණන් කැඳවීමේ ඉල්ලුම් පත්‍රය - 2024***

ගොඩනැගිලි අයිතිකරුගේ

1. සම්පූර්ණ නම -.
2. ලිපිනය -.
3. දුරකථන අංකය -.
4. ජාතික හැඳුනුම්පත් අංකය -.

ගොඩනැගිල්ල ඃ

1. කුළියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? -.
2. මාසික කුළී මුදල -.
3. පිහිටි ස්ථානයේ ලිපිනය -.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. -.
5. භූමියේ විශාලත්වය -.
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර -.
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේද? -.
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේද? -.
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/.......) -.
10. නවතා තැබීමට හැකි වාහන ගණන -.
11. රහැන් දුරකථන සබඳතා තිබේද? -.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් මා විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල්වරයා ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

........................................
අයදුම්කරුගේ අත්සන.

02 - 695

---

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - ඇල්පිටිය**

අධිකරණයට ඉදිරිපත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඇල්පිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද, මෙතෙක් හිමිකම් නොකියන ලද සහ වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙම පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ **2024.03.05 වැනි දින ප.ව. 02.30 ට** අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් කියන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය. වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කරන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් නියම කරන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන් හි අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

05. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත් හැඳුනුම්පතක් මඟින් තහවුරු කළ යුතුය.

ඩබ්ලිව්. එච්. එම්. අයි. වාසල,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,

2024 පෙබරවාරි මස 05 වැනි දින,
ඇල්පිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

1. 35304 - වැලි කියුබ් 01 ක ප්‍රමාණයක් අඩංගු යැයි කියනු ලබන වැලි තොගයක්.
2. 35546 - වැලි කියුබ් 01ක ප්‍රමාණයක් අඩංගු යැයි කියනු ලබන වැලි තොගයක්.
3. 35926 - වැලි කියුබ් 01ක ප්‍රමාණයක් අඩංගු යැයි කියනු ලබන වැලි තොගයක්.
4. 36081 - වැලි කියුබ් 01ක ප්‍රමාණයක් අඩංගු යැයි කියනු ලබන වැලි තොගයක්.
5. 33563 - වැලි කියුබ් 01ක ප්‍රමාණයක් අඩංගු යැයි කියනු ලබන වැලි තොගයක්.
6. 36780 - වැලි කියුබ් 01ක ප්‍රමාණයක් අඩංගු යැයි කියනු ලබන වැලි තොගයක්.
7. 36143 - වැලි කියුබ් 3/4 ක (තුන් කාලක්) ප්‍රමාණයක් අඩංගු යැයි කියනු ලබන වැලි තොගයක්.
8. 35190 - වැලි කියුබ් 1/4 ක (කාලක්) ප්‍රමාණයක් අඩංගු යැයි කියනු ලබන වැලි තොගයක්.
9. 35545 - වැලි කියුබ් 1/4 ක (කාලක්) ප්‍රමාණයක් අඩංගු යැයි කියනු ලබන වැලි තොගයක්.
10. 33406 - කොරිපස් ට්‍රැක්ටරයක් අඩංගු යැයි කියනු ලබන පස් තොගයක්
11. 37018 - වැලි කියුබ් 01 ක ප්‍රමාණයක් අඩංගු යැයි කියනු ලබන වැලි තොගයක්
12. AR 1515/22 - ෆයිබර් වර්ගයේ සිදුරුවී ඇති ඔරුව
13. AR 1267/22 - ෆයිබර් වර්ගයේ එන්ජිම රහිත අබලන් බෝට්ටුව
14. AR 1518/23 - අංක SP JM 6836 දරන HERO HONDA CD DAWN වර්ගයේ අබලන් යතුරු පැදිය (ලියාපදිංචි කළ හැක)
15. AR 1408/22 - WP BEW 4094 දරන HONDA NAVI වර්ගයේ ඉදිරිපස තැලී ඇති ඉදිරිපස අංක තහඩු රහිත යතුරු පැදියක් (ලි.ප. කළ හැක)
16. 18667 - අංක SP BGI 2086 දරන HONDA DIO SCV 110 කළු හා රතු පාට ප්‍රධාන විදුලි පහන රහිත යතුරු පැදියක් (ලි.ප. කළ හැක)

අබිලි ද්‍රව්‍ය

17. අඩි 10 හා අඩි 08 ප්‍රමාණයේ වහලයෙන් ගලවා ඉවත් කරන ලද ඇස්බැස්ටස් තහඩු 120 පමණ ප්‍රමාණයක් (අබලන් තත්ත්වයේ පවතී. බොහොමයක් කැඩී ගොස් ඇත)

02 - 434

---

## පොලිස් දෙපාර්තමේන්තුව

### පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ වෙන්දේසිය - කුරුණෑගල කොට්ඨාස ගබඩාව

කුරුණෑගල පොලිස් කොට්ඨාසයේ පොලිස් ස්ථාන වලින් බැහැර කරන ලද පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම **2024.03.05 වැනි දින පෙ.ව. 10.00** ට කුරුණෑගල පොලිස් ස්ථාන පරිශ්‍රයේ දී පැවැත්වේ. අදාළ භාණ්ඩ පරීක්ෂා කිරීම **2024.03.04 වැනි දින පෙ.ව. 09.00 සිට ප.ව. 04.00** දක්වා සිදු කළ හැකිය.

වෙන්දේසි භූමියට ඇතුලු වන සියලුම තරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බල පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

වෙන්දේසි භාණ්ඩ මිල දී ගැනීමේ දී එම අවස්ථාවේ දී මුදල් ගෙවා රිසිට්පත් ලබා ගත යුතු අතර **2024.03.05 වැනි දින ප.ව. 05.00** ට පෙර අදාළ භාණ්ඩ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතුයි. එසේ ඉවත් කර නොගන්නා කිසිදු භාණ්ඩයක් පිළිබඳ වගකියනු නොලැබේ.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, අවම ලංසුව ප්‍රකාශයට පත් කිරීම, ඇවරකර විකිණීම, වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන සියලුම තීරණ වෙන්දේසි මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස සැලකිය යුතුය.

භාණ්ඩ ලැයිස්තුව

| අ/අ | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | පරිඝනක පුටු | 08 |
| 02 | වෙබ් මයික් | 01 |
| 03 | වෙබ් කැමරා | 02 |
| 04 | හෙඩ් සෙට් | 03 |
| 05 | යූ. පී. එස්. යන්ත්‍ර | 16 |
| 06 | ෆොටෝ කොපි යන්ත්‍ර | 02 |
| 07 | කී බෝඩ් | 04 |
| 08 | මවුස් | 04 |
| 09 | විදුලි ස්ත්‍රික්ක | 04 |
| 10 | අවන් | 01 |
| 11 | ගෑස් කුකර් | 01 |
| 12 | සී. පී. යූ. යන්ත්‍ර | 09 |
| 13 | ස්කෑනර් | 01 |
| 14 | ප්‍රින්ටර් | 08 |
| 15 | කාර්යාල පුටු | 11 |
| 16 | සිංහල යතුරු ලියනය | 08 |
| 17 | ඉංග්‍රීසි යතුරු ලියනය | 01 |
| 18 | තණකොළ කපන මැෂින් | 04 |
| 19 | රූපවාහිනි | 02 |
| 20 | උදලු තල | 04 |
| 21 | විල්බැරෝ | 01 |
| 22 | ප්ලාස්ටික් පුටු | 164 |
| 23 | රථවාහන කොන්ස් | 04 |
| 24 | කල්දේරම් | 04 |
| 25 | රේක්ක | 01 |
| 26 | මේස හැඳි | 02 |
| 27 | විසි කැති | 01 |
| 28 | වතුර බොයිලේරුව | 01 |
| 29 | සිවිලිං පෑන් | 19 |
| 30 | පැක්ස් මැෂින් | 07 |
| 31 | විදුලි කේතල් | 03 |
| 32 | සිටුවන විදුලි පංකා | 22 |
| 33 | කෑම මේස පුටු | 02 |
| 34 | ඇඳි පුටු - යකඩ | 57 |
| 35 | පා පැදි | 05 |
| 36 | කොරහා | 01 |
| 37 | ගෑස් ලිප් - ටැප් 03 | 04 |
| 38 | යකඩ මේස | 01 |
| 39 | පොත් රාක්ක | 02 |
| 40 | ග්‍රයින්ඩර් | 01 |
| 41 | කතුරු | 02 |
| 42 | මොනිටර් | 02 |
| 43 | Processor Fan | 03 |
| 44 | DVD Writer | 02 |
| 45 | Tube Bulb Holder | 05 |
| 46 | Wall lamp | 01 |
| 47 | Spot Light | 01 |
| 48 | Door Closer | 01 |
| 49 | පංචර් | 04 |
| 50 | දඬු අඬු හැමර් කැබලි | 01 |
| 51 | පා පැදිවල කොටස් | 03 |
| 52 | ටයිල් කටර් | 01 |
| 53 | මේස විදුලි පංකා | 10 |
| 54 | බිත්ති විදුලි පංකා | 01 |
| 55 | Power Unit | 01 |
| 56 | Mother board | 02 |
| 57 | Cane 2 Litter | 01 |
| 58 | Cane 1 Litter | 01 |
| 59 | Cane 1/2 Litter | 01 |
| 60 | ඉනිමං (යකඩ ඇඳන් සඳහා) | 16 |
| 61 | ලී මේස | 03 |
| 62 | තාච්චි | 02 |
| 63 | යතුරු තහඩු | 08 |
| 64 | පිහි | 05 |
| 65 | ෆොටෝ කොපි මැෂින් | 02 |

02 - 559

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - දෙහිඅත්තකණ්ඩිය

### දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද දැව (දිරාපත්) ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ දැව (දිරාපත්) **2024.03.02** වැනි දින **පෙ.ව. 9.00** සිට දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර මත වෙන්දේසි ආරම්භ කිරීමට පැය 1/2 කට මත්තෙන් දැව පරීක්ෂා කර බැලීමට මහජනයාට ඉඩ දෙනු ලැබේ.

02. අධිකරණය විසින් ඉදිරිපත් කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි, එම දැව වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

03. වෙන්දේසියේ දැව මිල දී ගන්නා ගැණුම්කරුවන් තම අනන්‍යතාවය සනාථ කිරීමට ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

04. දැව මිල දී ගැනීම ලංකාවේ වලංගු මුදලින් කළ යුතු අතර, ඒ සඳහා අධිකරණය මගින් රිසිට්පතක් නිකුත් කරනු ලැබේ.

05. මිල දී ගන්නා ලද දැව වෙන්දේසි දින ප.ව. **4.00** ට පෙර වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතුය.

දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
දෙහිඅත්තකණ්ඩිය.

2024 පෙබරවාරි මස 05 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

***වෙන්දේසි කිරීම සඳහා ඇති දැව (දිරාපත්) ලැයිස්තුව***

ලොට් අංකයට අදාළව පහත සඳහන් පරිදි දැව කඳන් හා ඉරූ දැව ඇත.

| *ලොට් අංකය* | *ප්‍රමාණය* | |
|---|---|---|
| | *ඉරූ දැව* | *කඳන්* |
| 01 | - | 15 |
| 02 | - | 18 |
| 03 | - | 34 |
| 04 | 04 | 20 |

02 - 664

## මහෙස්ත්‍රාත් අධිකරණය - කළුවංචිකුඩි

### ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

මහෙස්ත්‍රාත් අධිකරණ නඩු විභාගවල දී අත්පත් කර රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ **2024.03.02** වැනි දින **පෙ.ව. 9.30** ට කළුවංචිකුඩි මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිතය.

කළුවංචිකුඩි මහෙස්ත්‍රාත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින **පෙ.ව. 8.30** සිට **පෙ.ව. 9.30** දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩ වල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත්කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහි දී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාර ගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳ කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසි සිදු කරන අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගි වීමට පැමිණෙන අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගතහැකි ලේඛන සමග පැමිණිය යුතුය.

ජේ. බී. ඒ. රන්ජිත්කුමාර,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - කළුවංචිකුඩි.

2024 පෙබරවාරි මස 05 වැනි දින,
කළුවංචිකුඩි මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ලියාපදිංචි අංකය* | *භාණ්ඩ* | *අයිතම ගණන* |
|---|---|---|---|
| 01 | NP/BFJ/7628 | යතුරු පැදිය | 01 |
| 02 | Yamaha 15HP | එංජින් | 01 |
| 03 | Yamaha 25HP | එංජින් | 01 |
| 04 | OFRP-A-5690 TCO | බෝට්ටුව | 01 |
| 05 | OFRP-A-1068 BCO | බෝට්ටුව | 01 |
| 06 | Yamaha 15HP | එංජින් | 01 |
| 07 | | බැටරි 12v | 02 |
| 08 | | පාපැදි | 07 |
| 09 | | ජංගම දුරකථන | 01 |
| 10 | | ජංගම දුරකථන | 01 |
| 11 | | උදැල්ල | 05 |
| 12 | | සවල් | 28 |
| 13 | | ලොකු ඇලුමිනියම් මුට්ටි | 02 |

| අනු. අංකය | ලියාපදිංචි අංකය | භාණ්ඩ | අයිතම ගණන |
|---|---|---|---|
| 14 | | ඇලුමිනියම් මුට්ටි | 11 |
| 15 | | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 16 | | යකඩ බාල්දි | 19 |
| 17 | | යකඩ තරාදිය | 04 |
| 18 | | ඉලෙක්ට්‍රොනික තරාදිය | 01 |

02 - 700

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මන්නාරම

### අධිකරණය මගින් රාජසන්තක කරන ලද හා මෙතෙක් අයිතිවාසිකම් පවරනු නොලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මන්නාරම මහෙස්ත්‍රාත් අධිකරණයේ පහත සඳහන් නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා මෙතෙක් අයිතිවාසිකම් පවරනු නොලැබූ පහත සඳහන් කර ඇති භාණ්ඩ මෙම අධිකරණ භූමිය තුළ තබා **2024.03.02 වැනි දින පෙ.ව. 09.30** ට ප්‍රසිද්ධියේ වෙන්දේසි කිරීමට නියමිතය.

02. මෙහි පහත සඳහන් කරනු ලැබූ කිසියම් භාණ්ඩයක් සඳහා කිසිවෙකු විසින් අයිතිය ප්‍රකාශ කරනු ලබන්නේ නම් තම ඉල්ලීම වෙන්දේසිය ආරම්භ වීමට පැය භාගයකට පෙර ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය ආරම්භ වීමට පැය භාගයකට පෙර මහජනයාට මෙම භාණ්ඩ පරීක්ෂා කළ හැක.

04. ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකිණීමට තබා ඇති යම්කිසි භාණ්ඩයක අවම ලංසුව නොලැබුණේ නම් වෙන්දේසියේ දී එම භාණ්ඩය ආපසු ලබාගැනීමේ අයිතිය අධිකරණය සතුයි.

05. විකුණනු ලැබූ භාණ්ඩවලට එවෙල්ම මුදල් ගෙවා භාණ්ඩ ඉවත් කළ යුතුයි. සෑම ගෙවීමක් ම මුදලින් ම ගෙවිය යුතු වන අතර චෙක්පත් භාරගනු නොලැබේ.

කේ. එල්. එම්. සජිත්,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මන්නාරම.

2024 පෙබරවාරි මස 07 වැනි දින,
මන්නාරම මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

**පා පැදි විස්තරය**

| අනු අංකය | නඩු අංකය | PR අංකය | නඩු භාණ්ඩ | වර්ගය | පා පැදි අංකය |
|---|---|---|---|---|---|
| 01 | AR/727/23 | - | පිරිමි පාපැදි - 01 | Lumala | 55955459 |
| 02 | AR/728/23 | - | කාන්තා පා පැදි - 01 | Lumala | 69892987 |
| 03 | AR/729/23 | - | පිරිමි පා පැදි - 01 | Lumala | - |
| 04 | AR/730/23 | - | හානි වී ඇති පිරිමි පා පැදි - 01 | Lumala | - |
| 05 | AR/731/23 | - | පිරිමි පා පැදි - 01 | Lumala | - |
| 06 | AR/732/23 | - | පිරිමි පා පැදි - 01 | Atlas | - |
| 07 | AR/733/23 | - | හානි වී ඇති පිරිමි පා පැදි - 01 | Lumala | 14A015242 |
| 08 | AR/734/23 | - | හානි වී ඇති පිරිමි පා පැදි - 01 | Lumala | - |
| 09 | AR/735/23 | - | හානි වී ඇති කාන්තා පා පැදි - 01 | Lumala | - |
| 10 | AR/736/23 | - | හානි වී ඇති කාන්තා පා පැදි - 01 | Lumala | - |
| 11 | AR/737/23 | - | හානි වී ඇති කාන්තා පා පැදි - 01 | Lumala | - |
| 12 | AR/738/23 | - | හානි වී ඇති පිරිමි පා පැදි - 01 | Lumala | - |
| 13 | AR/739/23 | - | හානි වී ඇති පිරිමි පා පැදි - 01 | Lumala | - |
| 14 | AR/66/21 | - | හානි වී ඇති කාන්තා පා පැදි - 01 | Lumala | 69933814 |

**ලියාපදිංචි කරන ලද යතුරු පැදි විස්තර**

| අනු අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ අංකය | නඩු භාණ්ඩ විස්තර | සංඛ්‍යාව | චැසි අංකය | එංජින් අංකය |
|---|---|---|---|---|---|---|
| 01 | B 61/11 | - | NPJQ - 5500<br>බජාජ් ගලිෆර් 111 සීසී | 01 | DDFBKJ39589 | DDMBKJ18797 |
| 02 | B38/06 | - | NPHQ - 8206<br>TVS වික්ටර් 110 සීසී | 01 | N3310F767714 | N3309M723837 |
| 03 | 45679 | - | NPBCW - 8956<br>බජාජ් පල්සර් 150 සීසී | 01 | MD2A11CZ6FWD40211 | DHZWFD36729 |
| 04 | AR/991/23 | - | NWBER - 7318<br>බජාජ් පල්සර් | 01 | MD2A11CZOHWK40394 | DHZWHK16642 |
| 05 | AR/848/23 | - | NWMM - 6629<br>TVS වික්ටර් | 01 | MD625GF4251D08684 | OF4D51095672 |
| 06 | AR/893/23 | - | EPVV - 6537<br>බජාජ් පල්සර් 150 සීසී | 01 | MD2DHDHZZTCC50326 | DHGBTC50847 |

**අමතර කොටස්වලට අදාළ යතුරු පැදි විස්තර**

| අනු අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ අංකය | නඩු භාණ්ඩ විස්තර | සංඛ්‍යාව | චැසි අංකය | එංජින් අංකය |
|---|---|---|---|---|---|---|
| 01 | 56550 | - | NPTH - 0453<br>හීරෝ හොන්ඩා CD 100 ඩිලක්ස් | 01 | MB4HA11EB69K00147 | 06K29E08329 |
| 02 | AR387/20 | - | NPBBL - 8657<br>හොන්ඩා | 01 | ME4KC192FE8015835 | KC19E-8-0065994 |
| 03 | AR 845/23 | - | NPBAV - 7663<br>TVS XL<br>සුපර් හෙවි ඩියුටි | 01 | MD621DD*****589** | ODIBE1366905 |
| 04 | AR/849/23 | - | NWWC - 9692<br>ෆැසන්ප්‍රෝ හීරෝ හීරෝ හොන්ඩා | 01 | MBLHA10EWAGH00421 | HA10EDAGH38494 |
| 05 | AR/847/23 | - | NPHI - 5823<br>බොක්සර් සීඩී ඩිලක්ස් | 01 | DFFBIL55418 | DMMBJL12363 |
| 06 | AR/905/23 | - | WPGD - 9547<br>හීරෝ හොන්ඩා සීසී 100 SS | 01 | OOL14F01538 | OOL13E03083 |
| 07 | AR/990/23 | - | NPTB - 5687<br>හීරෝ හොන්ඩා ක්ලොමර් | 01 | MB3J06ED6GHOO*** | O6GAPM00119 |
| 08 | AR/846/23 | - | WPJN - 5745<br>ලිංකොනල් 110 - 3 A | 01 | LLCLXN3A041B23738 | LC152FMH-CO445861 |
| 09 | AR/993/23 | - | TVS විගෝ | 01 | MD*26*G*OOIN9616* | OG4NG1985565 |
| 10 | B 67/18 | - | NPWH - 8435<br>හීරෝ හොන්ඩා ෆැෂන් ප්‍රෝ | 01 | MBLHA10EXBGA00079 | HAIOEDBGA20460 |
| 11 | AR 992/23 | - | NPMQ - 6615<br>TVS වික්ටර් | 01 | **6*5****6IE13876 | AF4E61000833 |
| 12 | 61877/23 | - | CPTM - 8314<br>හීරෝ හොන්ඩා ෆැෂන් ප්ලස් | 01 | MB3HA10EG7GCOO**0 | 07C08M23055 |

**අමතර කොටස්වලට අදාළ මෝටර් රථ විස්තර**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01 | 47306 | - | 47-0858<br>එයිසර් මිට්සුබිෂි මෝටර් ලොරි | 01 | - | 1-40621906 |
| 02 | AR238/17 | - | LB-7331 ජුපිත් NJ1026DSU මෝටර් ලොරිය | 01 | - | YZ485QB-B645185 |
| 03 | AR 944/23 | - | අත් ට්‍රැක්ටරය ඇක්රොඩෙක් | 01 | 005285 - F/TOG | 005285 - F/TOG |
| 04 | AR/995/23 | - | අත් ට්‍රැක්ටරය | 01 | 22786 | 5145921 |
| 05 | AR/584/23 | - | මෝටර් ලොරිය | 01 | - | - |

02 - 726

## සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - මනම්පිටිය

මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරනු ලැබූ වැලි හා බෝට්ටු 2 ක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

01. මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද වැලි කියුබ් 114 ක් හා එන්ජින් රහිත බෝට්ටු දෙකක් **2024.03.02** වැනි දින පෙ.ව. **9.00** ට වැලිකන්ද පොලිස් ස්ථාන භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන වැලි සහ බෝට්ටු සඳහා මුදල් ගෙවීමේ දී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් පමණක් ගෙවීම් සිදු කල යුතු අතර, චෙක්පත්, බැංකු අණකර කිසිවක් භාරගනු නොලැබේ.

03. වැලි හා බෝට්ටු මිල දී ගැනීමේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කල යුතුය.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා වැලි හා බෝට්ටු වෙන්දේසිය පවත්වන දිනයේ දී ප.ව. **5.00** ට පෙර අදාළ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

05. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම්, වෙන්දේසිය පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාර ගනු නොලැබේ.

06. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසු මුදල පිළි නොගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම වැලි හා බෝට්ටු වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

එම්. එම්. එෆ්. මින්නා,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,

2024 පෙබරවාරි මස 05 වැනි දින,
පොළොන්නරුව දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *නඩු අංකය* | *ස්ථානය* | *වැලි/පස් කියුබ් ප්‍රමාණය, භාණ්ඩ* |
|---|---|---|---|
| 01. | ඒ. ආර්. 1096 | වැලිකන්ද පොලිස් ස්ථානය | එන්ජින් රහිත බෝට්ටු 02 |
| 02. | ඒ. ආර්. 1096<br>ඒ. ආර්. 351<br>59377<br>59378<br>59395 | | වැලි කියුබ් 114 යි |

02 - 739

# රජයේ නොවන දැන්වීම්

## සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ කොන්දේසි ප්‍රකාර බොරලැස්ස ඇන්ඩ් සන්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් 2024 ජනවාරි මස 29 වැනි දින සමාගම් පනතේ 5 වැනි වගන්තිය යටතේ සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : බොරලැස්ස ඇන්ඩ් සන්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය : පීවී 00292988

| | | |
|---|---|---|
| ලියාපදිංචි කාර්යාලය | : | ප්‍රධාන වීදිය, මැදිරිගිරිය |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්වරු.

2024 පෙබරවාරි මස 09.

02 - 729

---

## දැන්වීමයි

2007 අංක 07 දරන ආඥාපනතේ 9 (2) වගන්තිය යටතේ " හයිනෙකෙන් ලංකා ලිමිටඩ්" නැමති සමාගම පහත දැක්වෙන පරිදි නාමය වෙනස් කර 2024.02.05 දින ලියාපදිංචි කරන ලදී.

| | | |
|---|---|---|
| සමාගමේ පෙර නාමය | : | හයිනෙකෙන් ලංකා ලිමිටඩ් |
| සමාගම් අංකය | : | පීබී 910 |
| ලියාපදිංචි ලිපිනය | : | 07 වන මහළ, එයිට්කන් ස්පෙන්ස් ටවර් 2 - 315, වොක්ස්හෝල් වීදිය, කොළඹ 02. |
| සමාගමේ නව නාමය | : | ඩීසීඑස්එල් බෲවරිස් ලංකා ලිමිටඩ් |

සෙන්ට්‍රල් කෝපරේට් ඇන්ඩ් කන්සල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.
අංක 48, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07.

02 - 714

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 320(1) වැනි වගන්තිය ප්‍රකාරව වූ නිවේදනයයි

අයුර්වා ට්‍රැවලර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 97859
සාමාජිකයන්ගේ ස්වෙච්ඡා ඇවර කිරීම

සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඇවර කිරීමක් වශයෙන් මෙම සමාගම ඇවර කිරීමටත් අංක 09, 03 මහළ, පාසල් වීදිය, කොළඹ 3 වරලත් ගණකාධිකාරී විදාන ආරච්චිලාගේ චානක පුෂ්පකුමාර මහතා සමාග මේ ඇවරකරු වශයෙන් වර්ෂ 2024 ක් වූ පෙබරවාරි මස 05 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීමටත්, අංක 09, තුන්වන මහළ, පාසල් වීදිය, කොළඹ 03 දී වර්ෂ 2024 ක් වූ පෙබරවාරි මස 05 වැනි දින පවත්වනු ලැබූ මෙම සමාගමේ අති විශේෂ මහා සභා රැස්වීමක දී 2007 අංක 7 දරන සමාගම් පනතේ (319)(1)(ආ) යටතේ යෝජනා සම්මතයක් අනුමත කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 320(1) දරන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

විදාන ආරච්චිලාගේ චානක පුෂ්පකුමාර,
ඇවරකරු.

අංක 09, 03 වන මහල,
පාසල් පටුමග, කොළඹ 03.

02 - 762/1

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 346(1) වන වගන්තිය ප්‍රකාරව වූ නිවේදනයයි

අයුර්වා ට්‍රැවලර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 97859
ඇවරකරුවෙකු පත්කිරීමේ නිවේදනය

වර්ෂ 2024 ක් වූ පෙබරවාරි මස 05 වැනි දින පවත්වනු ලැබූ මෙම සමාගමේ අති විශේෂ මහා සභා රැස්වීමේ දී අයුර්වා ට්‍රැවලර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ඇවරකරු වශයෙන් සමාගමේ විශේෂ යෝජනා සම්මතයෙන් මා පත්කරන ලද බව අංක 09, 3 වන මහල, පාසල් වීදිය, කොළඹ 03, වරලත් ගණකාධිකාරී විදාන ආරච්චිලාගේ චානක පුෂ්පකුමාර වන මම මෙයින් නිවේනය කරමි

විදාන ආරච්චිලාගේ චානක පුෂ්පකුමාර,
ඇවරකරු.

අංක 09, 03 වන මහල,
පාසල් පටුමග, කොළඹ 03.

02 - 762/2

---

## සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගමේ නම 2024 ජනවාරි මස 19 වැනි දින සිට වෙනස් කර ලද බව 2007 අංක 07 දරන සමාමේ පනතේ 9(2) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| සමාගමේ කලින් තිබූ නාමය | : | මැක්වුඩ්ස් එනර්ජි පීඑල්සී |
| සමාගමේ අංකය | : | පීවී 17807 පීබී/පීකිව් |
| ලියාපදිංචි කාර්යාලය | : | අංක 157බී, ශ්‍රී සද්ධර්ම මාවත, කොළඹ 10. |
| සමාගමේ නව නාමය | : | ග්‍රීන්ටෙක් එනර්ජි පීඑල්සී |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ලේකම්වරු.

02 - 672

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**
**මහනුවර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහනුවර මහ නගර සභා සීමාවන් තුළ අංක 221 තල්වත්ත ග්‍රාම නිලධාරි වසම හි තල්වත්ත ගමේ පිහිටි රොඩුපිහිල්ල වත්ත කොටසක් රොඩුපිහිල්ලවත්ත ලොට් අංක 01 සහ බලයලත් මානක එල්. ඒ. ද. සී. විජේතුංග විසින් 1973 දෙසැම්බර් මස 10 වැනි දින මැන සාදන ලද අංක 5409/5 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 5A කොටසක් සහ 5B දරන ඉඩම බලයලත් මානක ඩී. ආර්. අමේන්ද්‍ර විසින් 2016.02.26 වැනි දින (නැවත මැන ඒකාබද්ධ කොට කරන ලද අතුරු බෙදීමක්) සාදන ලද අංක 2030 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 2, 3, 4 දරන එකට යාවූ ඉඩම් කොටසක්වන බෙදා වෙන් කළ වරිපනම් අංක 102/147 : (ලොට් 02) 102/145, සහ 102/146 (ලොට් 03) සහ රෝස්නීත් නමැති ඉඩම් කොටස

ප්‍රමාණය අක්කර එකයි පර්චස් තිහයි දශම තිස්තුනයි (අ. 01, පර්. 30.33) විශාල ඉඩම එකී අංක 2030 දරන පිඹුරේ ලොට් 1 මතින් මාර්ග අයිතිය සහ අනෙකුත් අයිතීන් සමග සහ එහි පිහිටි සියලු දේ සමග වේ.

මහනුවර කටුගස්තොට පාර අංක 396 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි අශෝ කාර්ස් ජැපැන් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (Asho Cars Japan (Private) Limited) බන්ධනදායී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ

**වර්ෂ 2024ක් වූ මාර්තු මස 25 වැනි දින ප.ව. 1.00ට**

ඉහත ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය සඳහා* - 2019.07.19 වැනි දින රජයේ *ගැසට්* පත්‍රය ද 2019.07.15 වන දින මව්බිම, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න. තව ද නව වෙන්දේසිකරුවෙක් පත්කිරීමේ නිවේදනයට අදාළ යෝජනා සම්මුතිය සඳහා 2023.04.21 වැනි දින රජයේ *ගැසට්* පත්‍රය ද 2023.05.12 වැනි දින දිවයින, සහ ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම :-*

මහනුවර නගරයේ සිට මහියංගනය ප්‍රධාන පාරේ කිලෝමීටර් 03ක් පමණ තල්වත්ත දක්වා ගමන් කර දකුණට පිහිටි රණවිරු චන්දන කුමාර ගමගේ මාවතට පිවිස එම මාවතේ මීටර් 500ක් පමණ ගමන් ගත් පසු අදාළ දේපළ පිහිටා තිබේ. ("ජෙම් ඉන්" නමින් පිහිටි දේපළ)

*ගෙවීමේ ක්‍රමය .-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),

(02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),

(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),

(04) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000/=,

(05) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,

(06) ගැණුම්කරු විසින් අකාලික වටිනාකම බද්ද (VAT) ගෙවිය යුතුයි,

(07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ මහනුවර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

*හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :*

කළමනාකරු
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.
අංක 120, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.
දුරකතන අංකය. 081-2223163,
ෆැක්ස්. 0812201711

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්
බලයලත් වෙන්දේසිකරුවෝ
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු,

අංක 1/7/10, 1 වන මහළ, සුපර් මාර්කට් කම්පෙලේක්ස්,
කොළඹ 12.
දුරකථන අංකය : 011-2396520.

02 - 702

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**
**බණ්ඩාරගම - ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලයේ උඩුගහ පත්තුවේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරණ ප්‍රාදේශීය සභා සීමා තුළ 620 C - ඉංගිරිය උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත ඌරුගල (ඉංගිරිය) ගමේ පිහිටි "පුවක්වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ආර්. ගිණිගේ විසින් 2012.07.04 වැනි දින පිළියෙල කරන ලද අංක 709 දරන පිඹුරේ දැක්වෙන ලොට් A වශයෙන් බෙදා වෙන් කරන ලද ඉඩමේ කොටස

ප්‍රමාණය පර්චස් විසි නවයයි දශම නවයයි දෙක (පර්. 29.92) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලයේ උඩුගහ පත්තුවේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරණ ප්‍රාදේශීය සභා සීමා තුළ 620 C - ඉංගිරිය උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත ඌරුගල ගමේ පිහිටි "පුවක්වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. පී. ආර්. ආනන්ද විසින් 2016 මැයි 11 වන දින පිළියෙල කරන ලද අංක 1647A දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 වශයෙන් බෙදා වෙන් කරන ලද ඉඩමේ කොටස

ප්‍රමාණය පර්චස් විසි හයයි දශම දෙක (පර්. 26.2) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉංගිරිය, රත්නපුර පාරේ, අංක 27/A දරන ස්ථානයේ "නිව් කුමාරි ස්ටෝර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන රත්න කුමාර හපුතන්ත්‍රි සහ ගනේපල්ල කෝරාළලාගේ ප්‍රෙමරත්න මැණිකේ ණයකරුවන් හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනවල සඳහන් දේපළ,

පළමුවන උපලේඛනය - ලොට් A (පර්. 29.92)
**වර්ෂ 2024ක් වූ මාර්තු මස 26 වැනි දින ප.ව. 1.30 ට ද,**

දෙවන උපලේඛනය - ලොට් 2 (පර් 26.2)
**වර්ෂ 2024ක් වූ මාර්තු මස 26 වැනි දින ප.ව. 2.30 ට ද,**

ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය සඳහා* 2021.08.06 වැනි දින රජයේ *ගැසට්* පත්‍රය ද 2021.08.06 වැනි දින දිවයින, ඩේලි නිව්ස් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම.-*
පළමුවන උපලේඛනය - ඉංගිරිය නගරයේ සිට රත්නපුර පාර ඔස්සේ මීටර් 100ක් පමණ ගමන් කළ විට දේපළ පාරේ වම් පැත්තේ ඇත.

දෙවන උපලේඛනය - ඉංගිරිය නගරයේ සිට කොළඹ පාර ඔස්සේ මීටර් 150ක් පමණ ගමන් කළ විට පාරේ වම් පැත්තේ ඇති දේපළ වෙත ළඟා විය හැක.

***ගෙවීමේ ක්‍රමය.-***

විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) ලිපිකරු හා සෝඡක වේතනය රු. 2,000/=,
(05) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
(06) ගැණුම්කරු විසින් අකාලික වටිනාකම බද්ද (VAT) ගෙවිය යුතුයි,
(07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ බණ්ඩාරගම ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

***හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :***

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.
අංක 101, හොරණ පාර,
බණ්ඩාරගම.
දුරකතන අංකය : 0382290361,
ෆැක්ස් : 0382290362

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,

අංක 7/1/10, 1 වන මහළ, සුපර් මාර්කට් සංකීර්ණය,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංකය : 011-2396520.

02 - 703

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**
**විදේශීය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමා ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුඳුවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කුරුඳුවත්ත හි කොළඹ 07, බාන්ස් පෙදෙසේ, අංක 112 දරන ස්ථානයේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ඕ. ආර්. සිල්වා විසින් 1998.11.10 වැනි දින පිළියෙළ කරන ලද අංක 3087 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් X ලකුණු කරන ලද ඉඩම් කොටස.

ප්‍රමාණය පර්චස් විසි අටයි දශම තුනයි බිංදුව (පර්. 28.30) ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේ සමග වේ.

සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PV 17969 දරන සමාගම් පනත යටතේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන කොළඹ 14, ග්‍රෑන්ඩ් පාස් පාර, අංක 257 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති EI AND M (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කොළඹ 07, බාන්ස් පෙදෙස, අංක 112 දරන ස්ථානයේ බුවනෙක රාජමන්ත්‍රීලාගේ ශ්‍රීනාත් තිස්ස එදිරිසිංහ උකස්කරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට ඉහත උපලේඛනයේ සඳහන් දේපළ උකස් කර ඇත.

උපලේඛනය - ලොට් X (පර්. 28.30) **වර්ෂ 2024 ක් වූ මාර්තු මස 23 වැනි දින පෙ.ව. 11.30 ට ද,**

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අප වෙත ලබා දී ඇති උපදෙස් පරිදි අංක 21, සර් රසික් ෆරීඩ් මාවත, කොළඹ 01, ස්ථානයේ පිහිටි කොමර්ෂල් බැංකු විදේශ ශාඛා පරිශ්‍රයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය සඳහා* 2023.05.04 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2023.05.04 වැනි දින දිවයින, දි අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම.-*

දේපළ 02 - ටවුන් හෝල් ද සොයිසා වටරවුම් හංදියේ සිට (ඇස් රෝහලට විරුද්ධව) ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මාවත ඔස්සේ ගමන් කර තවත් මීටර් 450ක් පමණ ගමන් කර බාන්ස් පෙදෙසට වමට හැරී එකී පාරේ දකුණු අත පැත්තේ පිහිටි විෂයගත දේපළ වෙත ළඟා වීමට දළ වශයෙන් කිලෝමීටර් 1ක දුරක් ගමන් කරන්න.

*ගෙවීමේ ක්‍රමය.-*
විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000/=,
(05) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
(06) ගැණුම්කරු විසින් අකාලික වටිනාකම බද්ද (VAT) ගෙවිය යුතුයි,
(07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ විදේශීය ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

*හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න* :

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.
කොමර්ෂල් හවුස් (විදේශීය ශාඛාව),
අංක 21, සර් රසීක් ෆරීඩ් මාවත, තැ.පෙ. 856,
කොළඹ 01.
දුරකතන අංකය : 0112353544,
ෆැක්ස් : 0112347717

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු,

අංක 1/7/10, 1 වන මහල, සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
කොළඹ 12.
දුරකථන අංකය : 011-2396520.

02 - 704

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**
**බේස්ලයින් පාර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ කෝට්ටගේ මනෝජ් බුද්ධික පෙරේරා යන අය බන්ධනදායි වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ.

සෙව්වන්දි දිනුෂිකා මුණසිංහ විසින් දෙකම සහතික කරන ලද 2018. 02. 22 වැනි දිනැති අංක 1398 සහ 2018. 01. 16 වැනි දිනැති අංක 1367 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත උකස් කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දකුණ, පහළ අඹතලේ, කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 506A ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුඩා බුත්ගමුව ග්‍රාමයේ පිහිටි "අඹගහවත්ත *හෙවත්* ගල්වත්ත" ලෙස හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු එස්. දික්කුඹුර විසින් සාදන ලද 2005.02.24 දිනැති අංක 1290 දරන පිඹුරේ ලොට් 2 ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙහිම ලොට් 1 ද, නැගෙනහිරට : මෙහිම ලොට් 4 ද, දකුණට : මෙහිම ලොට් 3 ද, බටහිරට : එම්. ඒ. ඩී. මැගී පෙරේරාගේ ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම එකයි බිංදුවක් (පර්. 10.10) ප්‍රමාණයකින් යුක්ත වන අතර එකී අංක 1290 දරන පිඹුර කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/ පත්‍රිරුව F 196/102 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එස්. ඒ. පීරිස් විසින් සාදන ලද 1986.11.23 දිනැති අංක 5182 දරන පිඹුරේ ලොට් 2E මතින් උඩින් සහ දිගේ මාර්ග අයිතිය ද සමඟ වේ.

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව ඉහත විස්තර කරන ලද දේපළ,

**2024 මාර්තු මස 13 වැනි දින පස්වරු 1.30ට**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම .-* ලෝ ලෙවල් පාරේ පිහිටි කොටිකාවත්ත මංසන්ධියේ සිට කඩුවෙල දෙසට මීටර් 150ක පමණ දුරක් ගොස් වම්පසට පිහිටි T.C. පාරට හැරී තවත් මීටර් 300ක පමණ දුරක් ඉදිරියට ගොස් දකුණුපසට ඇති සාරනක පාරට හැරී තවත් මීටර් 250ක පමණ දුරක් ගොස් වම්පසට ඇති ගල්වත්ත මාර්ගයට හැරී තවත් මීටර් 150ක පමණ දුරක් ගොස් දේපළට පිවිසෙන අඩි 10 පළල ඇති බොරළු මාර්ගයට හැරී මීටර් 100ක පමණ දුරක් ගිය විට මාර්ගයේ වම්පසින් අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම .-* රජයේ *ගැසට් පත්‍රයේ* 2023.10.06 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප, ඩේලිමිරර් සහ තිනකුරල් යන පුවත්පත්වල 2023.10.03 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000/-
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 2,000/-,
6. සියලුම ප්‍රචාරක වියදම්.
7. ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී. අංක 658, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09, දුරකතනය : 011 2685316, 011 2685314.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

එම්. එච්. ටී. කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්,

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක. 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011 3068185, 011 2572940

02 - 690

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**
**- බලංගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ, හෙළඋඩ පත්තුවේ, බලංගොඩ නාගරික සහා සීමා ඇතුළත රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ G.N. Div. 256A බලංගොඩ නගරයේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත බලංගොඩ නගරයේ පිහිටි "කරව්කැටියේ එස්ටේට්" (කොටස) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, ඒ. රත්නම් විසින් 2003.01.28 වන දින පිළියෙළ කරන ලද අංක 90/03 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස, ප්‍රමාණය රූඩ් එකයි පර්චස් තිස්තුනයි දශම නවයයි බිංදුව (රූ. 1, පර්. 33.90) විශාල ඉඩම සමග නොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

එකී ඉඩමට වෙන්කරන ලද මාර්ග අයිතිය සමග වේ.

ගෝවින්නගේ අතුල පෙරේරා ගුණසේකර සහ පොල්වෙත්තේ රත්තරන් හාමිලාගේ අයේෂා මධුවන්ති ණයකරුවන් හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ,

**වර්ෂ 2024 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින ප.ව. 2.30ට,**

ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය සඳහා* 2021.05.07 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද* 2021.05.07 වැනි දින දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම .-*

බලංගොඩ නගරයේ ප්‍රධාන ඔරලෝසු කණුව හංදියේ සිට බාන්ස් රත්වත්ත මාවත ඔස්සේ කරව්කැටිය පාර දක්වා මීටර් 300ක පමණ දුරක් ගමන් කර අනතුරුව වමට හැරී වම් අත පැත්තේ ප්‍රවේශ පාර දක්වා මීටර් 50 ක් පමණ කරව්කැටිය පාර ඔස්සේ ගමන් කර අනතුරුව වමට හැරී විෂයගත දේපළ දක්වා මීටර් 100ක පමණ දුරක් මෝටර් රථ ප්‍රවේශ විය හැකි තාර පාර ඔස්සේ ගමන් කළ විට දේපළ පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත. (වාමර පාරට යාබදව)

*ගෙවීමේ ක්‍රමය .-*

විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) නොතාරිස් ගාස්තුව රු. 2,000/-,
(05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500/=,
(06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
(07) ගැණුම්කරු විසින් අකාලික වටිනාකම බද්ද (VAT) ගෙවිය යුතුයි,
(08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ බලංගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

*හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න* :

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.
අංක 27, හපුතලේ පාර,
බලංගොඩ.
දුරකතන අංකය : 0452286719,
ෆැක්ස් : 0452286700

එල්. බී. සේනානායක
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 1/7/10, 1 වන මහළ, සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
කොළඹ 08.
දුරකතන අංකය : 011-2396520.

02 - 705

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. මගින්**
**(බලංගොඩ ශාඛාව)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**පළමු උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ, හෙළඋඩ පළාතේ, බලංගොඩ නාගරික සභා සීමාව තුළ

බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කිරිදිගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිරිදිගල පිහිටි වැවේකුඹුර හේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. රත්නම් විසින් 2000.07.07 වැනි දින පිළියෙළ කරන ලද අංක. 8194 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 දරන

ප්‍රමාණය පර්චස් පහයි දශම හයයි නවයක් (පර්. 5.69) විශාල ඉඩම සමග නොඩනැගිලි, සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

### දෙවන උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ නාගරික සභා සීමාව තුළ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ G.N.Div.No. 260D ගොඩකුඹුර ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත නැදුන්ගමුව ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් සහතික කරන ලද කැඩැස්තර සිතියමේ අංක 620047 තුළ දැක්වෙන ඉඩම් කළාප අංක 35, දරන ප්‍රමාණය හෙක්ටයාර් බිංදුවයි දශම එකයි අටයි හතයි හය (හෙක්ටයාර් 0.1876) විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

### හතරවන උපලේඛනය (තොග වෙළඳ බඩු බාහිරාදිය)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ, හපුතලේ පාරේ, අංක 70 දරන ස්ථානයේ පරිශ්‍රය තුළ සහ මත දැනට තිබෙන ණයකරුගේ කුමන හෝ සියලුම ශුද්ධ තොග වෙළඳ බඩු බාහිරාදිය සහ දේ, අනාගතයේ දී බලංගොඩ, හපුතලේ පාරේ අංක 70 දරන ස්ථානයට ගබඩා කළ හැකි මෝටර් සයිකල් සහ අමතර කොටස් සහ අනෙකුත් අයිතම තොග සහ එබඳු කුමන හෝ දේ සහ ණයකරු දැනට සිටින හෝ මින්මතු ඕනෑම අවස්ථාවක සහ කලින් කලට ව්‍යාපාරය කරගෙන යා හැකි අනෙකුත් ගුදම් ගබඩාවන් හි සහ පරිශ්‍රයන් හි ඇති සහ තබා ඇති හෝ කලින්කලට ගබඩා කරනු ලැබිය හැකි සහ තැබිය හැකි තොග වෙළෙඳ බඩු බාහිරාදිය සහ දේ ඇති සහ තබා ඇති සහ එසේම මින්මතු තවදුරටත් මෙම උකස පවත්වාගෙනයාම තුළ දී ඕනෑම අවස්ථාවක දී කලින්කලට ඉහත කී පරිශ්‍ර, ගුදම් හෝ ගබඩා මත ගබඩා කරන්නට හෝ තබා හෝ තියන්නට ගෙනෙනු ලබන සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අනෙකුත් ස්ථානයන්හි ව්‍යාපාරයේ සියලුම හෝ අනෙකුත් ස්ථානය හෝ ස්ථාන වෙතට ණයකරු ඕනෑම අවස්ථාවක දී මෙහි කලින් සඳහන් කරන ලද එකී තොග හෝ ගුදම් හි වාප්පු නිෂ්කාශන එහි ව්‍යාපාරය හෝ වෙළඳාම හෝ ගබඩාව මත ඉවත් කරන හෝ ගෙන යන මුළුමනින්ම වන තොග වෙළඳ බඩු සියල්ල.

වීරවර්ධන නල්ලපෙරුම මුදියන්සේලාගේ ප්‍රේමරත්න බන්ඩාර ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට උකස් කරන ලද ඉහත 1, 2, සහ 4 වන උපලේඛනවල සඳහන් දේපළ සහ තොග වෙළඳ බඩු බාහිරාදිය.

**දෙවන උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2024ක් වූ අප්‍රේල් මස 01 වැනි දින පෙ.ව. 10.00ට ද,**

**පළමුවෙන උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2024ක් වූ අප්‍රේල් මස 01 වැනි දින පෙ.ව. 11.30 ට ද,**

**හතරවන උපලේඛනයේ සඳහන් තොග වෙළඳ බඩු බාහිරාදිය වර්ෂ 2024 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින ප.ව. 12.00 ට ද,**

ඉහත ස්ථානවලදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය සඳහා* 2019.08.30 වැනි දින රජයේ *ගැසට්* පත්‍රයද දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරි පුවත්පත් පළකර ඇත.

*ඉඩමට පිවිසීම .-*

*පළමුවන හා හතරවන උපලේඛන. -* බලංගොඩ පොලිස් ස්ථානයේ සිට තෝරාගත් දේපළ දක්වා මීටර් 400ක පමණ දුරක් හපුතලේ පාර ඔස්සේ ගමන් කරන්න "බලංගොඩ මෝටර්ස්" නම් දරන මෙම දේපළ පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

*දෙවන උපලේඛනයට .-* බලංගොඩ නගරයේ සිට කල්තොට පාර ඔස්සේ කිලෝමීටර් 12.5ක් ගමන් කර ඉබුලමුල පාරට දකුණට හැරී පාරේ වම් අත පැත්තේ පිහිටි අදාළ දේපළ වෙත තවත් මීටර් 200ක් පමණ ගමන් කරන්න.

*ගෙවීමේ ක්‍රමය .-*

විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. :

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),

(02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),

(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),

(04) නොතාරිස් ගාස්තුව රු. 2,000/=,

(05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500/-,

(06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,

(07) ගැණුම්කරු විසින් එකතු කල වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි,

(08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ බලංගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

*හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :*

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.
අංක 27, හපුතලේ පාර,
බලංගොඩ.
දුරකතන අංකය : 0452286719,
ෆැක්ස් : 0452286700

එල්. බී. සේනානායක
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 1/7/10, 1 වන මහල, සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
කොළඹ 08.
දුරකථන අංකය : 011-2396520.

02 - 707

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, බොරලැස්ගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක B-533D දරන නැගෙනහිර, බොරලැස්ගමුව ග්‍රාම නිලධාරි වසමේ, බොරලැස්ගමුවේ පිහිටි දෙල්ගහවත්ත සහ අළුබෝගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 1023 සහ 1994.07.07 දින දරන පිඹුරේ නිරූපිත ලොට් B2A3 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස

ප්‍රමාණය : පර්චස් දහයක් (පර්. 10)

විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 47/130 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, ඉහත කී ඉඩමට මෙහි පහත සවිස්තරව දක්වා ඇති පාර සඳහා වෙන්කළ ඉඩම් මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ වෙනත් එවැනි අයිතිවාසිකම් ද සමග ය.

1. ඉහත කී බොරලැස්ගමුවේ පිහිටි දෙල්ගහවත්ත සහ අළුබෝගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 1023 සහ 1994.07.07 දින දරන පිඹුරේ නිරූපිත ලොට් B2A7 වශයෙන් ලකුණ කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හයයි පහක් (පර්. 4.65) විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ දෙල්කඳ, නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2994/11 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී බොරලැස්ගමුවේ පිහිටි දෙල්ගහවත්ත සහ අළුබෝගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 669 සහ 1993.08.07 සහ 1993.09.28 දෙදින දරන පිඹුරේ නිරූපිත ලොට් B4 (පාර සඳහා වෙන් කිරීම) වශයෙන් ලකුනු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම හතරයි එකක් (පර්. 10.41) විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2616/248 යටතේ ලියාපදිංචි කර ඇත.

3. ඉහත කී බොරලැස්ගමුවේ පිහිටි දෙල්ගහවත්ත සහ අළුබෝගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 669 සහ 1993.08.07 සහ 1993.09.28 දෙදින දරන පිඹුරේ නිරූපිත ලොට් B2B (පාර සඳහා වෙන්කිරීම) වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස ප්‍රමාණයෙන් පර්චස් හතරක් (පර්.4) විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2616/249 යටතේ ලියාපදිංචි කර ඇත.

4. ඉහත කී බොරලැස්ගමුවේ පිහිටි දෙල්ගහවත්ත සහ අළුබෝගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 669 සහ 1993.08.07 සහ 1993.09.28 දෙදින දරන පිඹුරේ නිරූපිත ලොට් B2B (පාර සඳහා වෙන්කිරීම) වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම තුනයි අටක් (පර්. 2.38) විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ, දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2616/262 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, බොරලැස්ගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක B-533D දරන නැගෙනහිර, බොරලැස්ගමුව ග්‍රාම නිලධාරි වසමේ, බොරලැස්ගමුවේ පිහිටි දෙල්ගහවත්ත සහ අළුබෝගහවත්ත නමැති ඉඩමට බලයලත් මින්න්දෝරු බී. එස්. අලහකෝන් විසින් මැන සාදන ලද අංක 6671 සහ 2010 නොවැම්බර් මස 15 දින දරන පිඹුරේ නිරූපිත ලොට් X වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන් කළ බිම් කොටස

ප්‍රමාණය පර්චස් හතක් (පර්. 7)

විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, වැවිලි, පළතරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 786/52 යටතේ ලියාපදිංචි කර ඇත.

1. ඉහත කී බොරලැස්ගමුවේ පිහිටි දෙල්ගහවත්ත සහ අළුබෝගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 1023 සහ 1994.07.07 දින දරන පිඹුරේ නිරූපිත ලොට් B2A7 වශයෙන් ලකුනු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස

පර්චස් හතරයි දශම හයයි පහක් (පර්. 4.65)

විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2994/11 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී බොරලැස්ගමුවේ පිහිටි දෙල්ගහවත්ත සහ අළුබෝගහවත්ත නමැති ඉඩමට බලයලත් මින්නදෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 669 සහ 1993.08.07 සහ 1993.09.28 දෙදින දරන පිඹුරේ නිරූපිත ලොට් B1B (පාර සඳහා වෙන්කිරීම) වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස

ප්‍රමාණය පර්චස් හතරක් (පර්. 4)

විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2616/249 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් විසින් මැන සාදන ලද අංක 6671 සහ 2010.11.15 දින දරන පිඹුරේ නිරූපිත ලොට් Z පාර සඳහා වෙන්කළ ඉඩම මතින් ගමන් කිරීමේ පොදු මාර්ග අයිතිය ද සමග ය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. නදීකා ශාමලී කුමාරි රාජපක්ෂ විසින් සහතික කරන ලද අංක 799 සහ 2017 ජුනි මස 23 දින දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. නදීකා ශාමලී කුමාරි රාජපක්ෂ විසින් සහතික කරන ලද අංක 801 සහ 2017 ජුනි මස 23 දින දරන උකස් බැඳුම්කරය මගින් බන්ධනදායි වශයෙන් ආනන්ද කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ උකස්කරුවන් වශයෙන් තනිප්පුලි අප්පුහාමිලාගේ දොන් ආනන්දසිරි ජයසිංහ සහ මහමඩ කලපුවගේ වයලට් ද සිල්වා (ආනන්ද කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂවරුන් සහ කොටස්හිමියන් වන) විසින් මෙහි පහත පළමුවන උපලේඛනයේ සවිස්තරව දැක්වෙන අයිතිවාසිකම්. දේපළ සහ පරිශ්‍රය ද, උකස්කරු වශයෙන් මහමඩ කලපුවගේ වයලට් ද සිල්වා (ආනන්ද කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂවරියක සහ කොටස්හිමියෙකු වන) විසින් මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව දැක්වෙන අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රයද, එකී ආනන්ද කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන්, කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද; එකී බැඳුම්කර මගින් අප තබන ලද ඉහත කී මූල්‍ය පහසුකම් ගෙවා පියවා දැමීම ඉහත කී ආනන්ද කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද; නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව,

පළමුවන උපලේඛනයේ දැක්වෙන දේපළ, ලොට් B2A3,

**වර්ෂ 2024 ක් වූ මාර්තු මස 20 වැනි දින ප.ව. 1.00 ට ද,**

දෙවන උපලේඛනයේ දැක්වෙන දේපළ, ලොට් X

**වර්ෂ 2024 ක් වූ මාර් මස 20 වැනි දින ප.ව. 2.00ට ද,**

අදාළ දේපළ පිහිටි ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ වෙත පිවිසීම්* :
පළමුවන උපලේඛනය ලොට් B2A3 (පර්. 10)

කොළඹ සිට බොරලැස්ගමුව නගර මධ්‍යය දක්වා ගමන් කර මහරගම පාරට වමට හැරී (එසේම දෙහිවල මහරගම පාර ලෙස හඳුන්වන, බස් මාර්ග අංක 119) පාරේ දකුණු අත පැත්තේ පිහිටි ඇඹිල්ලවත්ත පාර මුණ ගැසීමට කිලෝමීටර් 1.2ක් පමණ ගමන් කර ඉන්පසු ඇඹිල්ලවත්ත පාර ඔස්සේ මීටර් 400ක් පමණ ගමන් කර කටුවාවල මාවත ඔස්සේ මීටර් 15ක් පමණ ගමන් කර පළමුවන පටුමගට වමට හැරී මීටර් 150ක් පමණ ගමන් කර අවසානයේදී, අඩි 12 පළල මෝටර් රථ ප්‍රවේශයවිය හැකි බොරලු පාරට වමට හැරී තවත් අඩි 70ක් පමණ ගමන් කළ විට දේපළ වෙත ළඟා විය හැක.

දෙවන උපලේඛනය ලොට් X (පර්. 7)

කොළඹ සිට බොරලැස්ගමුව නගර මධ්‍යය දක්වා ගමන් කර මහරගම පාරට වමට හැරී (එසේම දෙහිවල මහරගම පාර ලෙස හැඳුන්වන, බස් මාර්ග අංක 119) පාරේ දකුණු අත පැත්තේ පිහිටි ඇඹිල්ලවත්ත පාර මුණ ගැසීමට කිලෝමීටර් 1.2 ක් පමණ ගමන් කර කටුවාවල මාවත ඔස්සේ මීටර් 15ක් පමණ ගමන් කර පළමුවන පටුමගට වමට හැරී මීටර් 150ක් පමණ ගමන් කර අවසානයේ දී, අඩි 12 13 1/2 පළල මෝටර් රථ ප්‍රවේශවිය හැකි බොරළු පාරට වමට හැරී තවත් අඩි 110ක් පමණ ගමන් කළ විට දේපළ වෙත ළඟා විය හැක.

*ගෙවීම් කළ යුතු ආකාරය* .- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි තැන්පත් කළ යුතුය,
(03) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(04) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් රු. 100%,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2000/-,
(07) නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 8000/-,

*අනිකුත් තොරතුරු සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න* :

නීති දෙපාර්තමේන්තුව,
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.
අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.
දුරකතන අංකය 0114218746,

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 7/1/10, 1 වන මහළ, සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංකය : 011-2396520.

02 - 706

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - පස්සර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**පළමුවන උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ නුවර කඩවත් සතරේ නුවර මහනගර සභා සීමා තුළ ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 239, මහයියාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත මහයියාව ගමේ පිහිටි "කටුගස්තොට පාරේ, වරිපනම් අංක 128 (කලින් 94A) දරන කලහදෙනිය එසේම වරිපනම් අංක 94A සහ 128 දරන බෙදූ කොටසක් ලෙස හඳුන්වන (අංක 844B දරන පිඹුර ප්‍රකාරව, කලහොදෙනිය ලෙස දක්වන ලද මෙම ඉඩම (කොටස)" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, කේ.ඩබ්.එම්.වී. මාපිටිගම විසින් 2017.01.27 වැනි දින පිළියෙළ කරන ලද අංක 844B දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස.

ප්‍රමාණය පර්චස් හතයි දශම පහ (පර්. 7.5) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

දෙදෙනාම නුවර, කටුගස්තොට පාරේ, අංක 128 දරන ස්ථානයේ පල්ලේ ගෙදර මංජුල තිලකරත්න සහ රාජපක්ෂ මුදියන්සේලා ඉන්දුමාලා නිරෝශිනි කුමාරි රාජපක්ෂ ණයකරුවන් හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ,

**උපලේඛනය**

ලොට් 1 (පර්. 7.5)
**වර්ෂ 2024ක් වූ මාර්තු මස 21 වැනි දින ප.ව. 12.00ට**

ඉහත ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය සඳහා* 2023.09.22 වැනි දින රජයේ *ගැසට්* පත්‍රයද 2023.09.27 වැනි දින දිවයින, දි අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම .-*
නුවර නගරයේ ඔරලෝසු කණුව හංදියේ සිට කටුගස්තොට පාර ඔස්සේ කිලෝමීටර් 1.5ක් පමණ ගමන් කළ විට එයට මායිම්ව දකුණු අත පැත්තේ ඇති විෂයගත දේපළ වෙත ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය .-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000/=,
(05) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
(06) ගැණුම්කරු විසින් අකාලික වටිනාකම බද්ද (VAT) ගෙවිය යුතුයි,
(07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ පස්සර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

*හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න* :

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.
අංක 278, 280,
ප්‍රධාන වීදිය, සංකීර්ණය,
පස්සර.
දුරකතන අංකය : 0552288005,
ෆැක්ස් : 0552288008

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු,

අංක 7/1/10, 1 වන මහළ, සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංකය : 011-2396520.

02 - 708

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - බලංගොඩ ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර

**පළවෙනි උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත කෝරළයේ, තලපිටගම් පත්තුවේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභා සීමාවේ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත මුත්තෙට්ටුවෙගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මුත්තෙට්ටුවෙගම පිහිටි "දෙයියන්නේ කුඹුරේගොඩ" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, බන්දුසේන විමලධර්ම විසින් 2017.09.28 වැනි දින පිළියෙල කරන ලද අංක 1856 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස,

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් එක (රූ.01, පර්. 01) ක *හෙවත්* (හෙක්ටයාර් 0.1037) ක විශාල ඉඩම සමග එහි පිහිටි හෝ ඊට අනුබද්ධ සියලු දේත් සමග වේ.

**දෙවන උපලේඛනය**

01 වැනි දේපළ.- සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ නාගරික සභා සීමා තුළ මැද කෝරළයේ, හෙළඋඩ පළාතේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තුඹගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිරිදිගල ගමේ මීගොඩ පිහිටි "අස්වැද්දුම වත්ත" නමැති, බලයලත් මිනින්දෝරු, ඒ. රත්නම් විසින් 1998.10.27 වැනි දින පිළියෙළ කරන ලද අංක 6869/A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස,

ප්‍රමාණය පර්චස් හය (පර්. 6) ක් විශාල වූ ඉඩම සමග එහි පිහිටි සියලුදේත් සමග වේ.
02 වන දේපළ ඉහත කී පරිදි පිහිටි බෙදා වෙන් කරන ලද "අස්වැද්දුම වත්ත" ලෙස නම්කොට හඳුන්වනු ලබන ලොට් 05 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස,

ප්‍රමාණය පර්චස් හතරයි දශම එක (පර්. 04.1) ක විශාල වූ ඉඩම සමග එහි පිහිටි සියලුදේත් සමග වේ

03 වැනි දේපළ.- ඉහත කී පරිදි පිහිටි "අස්වැද්දුම වත්ත" හි උතුරු මායිමට කිට්ටු බෙදන ලද කොටස ලෙස නම්කොට හඳුන්වනු ලබන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස,

ප්‍රමාණය පර්චස් දෙකයි දශම පහ (පර්. 2.5) විශාල වූ ඉඩම සමග එහි පිහිටි සියලුදේත් සමග වේ.

බලංගොඩ, කිරිදිගල පාරේ, අංක 258 දරන ස්ථානයේ තුසේ පෙරේරා ලියනරාළලාගේ ජූඩ් හර්මන් කැමිලස් පෙරේරා ණයකරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කරන ලද ඉහත උපලේඛනවල සඳහන් දේපළ,

2 වන උපලේඛනය : **වර්ෂ 2024 ක් වූ අප්‍රේල් මස 02 වැනි දින පෙ.ව. 10.00 ට ද,**

1 වන උපලේඛනය : **වර්ෂ 2024 ක් වූ අප්‍රේල් මස 02 වැනි දින ප.ව. 12.30 ට**

ඉහත ස්ථානවලදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය සඳහා* 2021.10.29 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද* 2021.11.03 වැනි දින දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න.

ඉඩම් වෙත පිවිසීම් : *1 වන උපලේඛනය*

බලංගොඩ නගරයේ සිට හපුතලේ පාර ඔස්සේ කිලෝමීටර් 17ක පමණ දුරක් ගමන් කර පඹහින්න හංදිය දක්වා පැමිණ අනතුරුව විශ්ව විද්‍යාල පාර ඔස්සේ මීටර් 100ක් පමණ ගමන් කර නැවත වමට හැරී මෝටර් රථ ප්‍රවේශ විය හැකි පාර ඔස්සේ දකුණු අත පැත්තේ ප්‍රවේශ පාර දක්වා කිලෝමීටරයක් පමණ ගමන් කර (දේශක වල්ගමගේ නිවසට යාබදව) අනතුරුව මෙම ප්‍රවේශ පාර ඔස්සේ අදාළ දේපළ දක්වා මීටර් 30ක් පමණ ගමන් කළ විට විෂයගත ඉඩම දකුණු අත පැත්තේ පිහිටා ඇත.

*දෙවන උපලේඛනය*

බලංගොඩ නගරයේ සිට හපුතලේ පාර ඔස්සේ මීටර් 900ක් පමණ ගමන් කළ විට හපුතලේ පාරේ, වරිපනම් අංක 258 දරන, පාරේ දකුණු අත පැත්තේ විෂයගත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* : විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) නොතාරිස් ගාස්තුව රු. 2,000/-,
(05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500/-,
(06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
(07) ගැණුම්කරු විසින් එකතුකල වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි,
(08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ බලංගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :*

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.
අංක 27, හපුතලේ පාර,
බලංගොඩ.
දුරකතන අංකය : 0452286719
ෆැක්ස් : 0452286700

එල්. බී. සේනානායක
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 1/7/10, 1 වන මහළ,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
කොළඹ 08.
දුරකථන අංකය : 011-2396520.

02 - 709

---

**යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, අදිකාරි පත්තුවේ, කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 502 දරන රාජසිංහගම ග්‍රාම නිලධාරී වසමේ, මුල්ලේරියාව උඩුමුල්ල ගමේ පිහිටි, ගල්බරාව හරස් පාරේ, 3 වන පටුමගේ, වරිපනම් අංක 60/8 දරන, "හලගහලන්ද" සහ "හල්බරාව" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් මැන සාදන ලද අංක 5302 සහ 2013.11.04 සහ 2013.11.06 දිනයන් දරන පිඹුරේ නිරූපිත ලොට් 7A වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටස (බලයලත් මිනින්දෝරු එන්. ඒ. ගුණවර්ධන විසින් මැන සාදන ලද අංක 859 සහ 2002.02.20 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 7 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කැබැල්ලේ පවත්නා මායිම්වල නැවත මැන බෙදා වෙන්කිරීමක් වන,

ප්‍රමාණය පර්චස් අටයි දශම තුනයි බිංදුවක් (පර්. 8.30)
*නොහොත්* හෙක්ටයාර 0.0210ක්

විශාල ඉඩම් කැබැල්ල සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලුදේත් සමග ය. (මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 78/96 දරන වෙළුමේ/පත්‍රිකාවේ ලියාපදිංචි කර ඇත.)

තව ද, ඉහත කී ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් මැන සාදන ලද අංක 5301 සහ 2013.11.06 දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 6B , අංක 5302 සහ 2013.11.04 සහ 2013.11.06 දිනයන් දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කළ ලොට් 7C, අංක 859 සහ 2002.02.20 දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කළ ලොට් 1 සහ අංක 859 සහ 2002.02.20 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 2 මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය. (මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පිළිවෙළින් F 191/12, F 78/97, F 78/99, F 78/100 දරන වෙළුමේ/පත්‍රිකාවේ ලියාපදිංචි කර ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කොළඹ 06, පාමංකඩ, ඊස්වරි පාර, අංක 34/1/1 යන ලිපිනයේ පදිංචි සහ එකී ජනරජයේ දෙහිවල, බෙල්ලන්තර පාර, අංක 41 1/1 යන ලිපිනයේ පදිංචි, නබීල් අහමඩ් තාහීර් (ජාතික හැඳුනුම්පත් අංක 771550746V දරන,) (මෙහි මින් මතු "බන්ධනදායී" වශයෙන් හඳුන්වන,) යන අය විසින් සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PB676PQ දරන යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු ඇතැම් තැනක "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වන,) වෙතින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව ප්‍රදානය කරන ලද ණය සහන කාලසීමා පහසුකම් යටතේ තදනන්තරව ප්‍රතිලේඛනගත/ ප්‍රතිව්‍යුහගත කිරීම භාජනය වූ නිවාස ණය පහසුකමක් (මෙහි මින්මතු "එකී නිවාස ණය පහසුකම" වශයෙන් හඳුන්වන,) ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායී විසින්, ප්‍රසිද්ධ නොතාරිස් කේ. පී. නයන්ත්‍රා සහතික කරන ලද අංක 815 සහ 2018.05.22 දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය ලියා අත්සන්කොට තබා, ඉහත කී නිවාස ණය පහසුකමේ මුල් හිඟ මුදල නිසා එකී බන්ධනාදායි වෙතින් යූනියන් බැංකුවට අයවිය යුතු ඉහත කී නිවාස ණය පහසුකම් සහ පොළිය ආපසු ගෙවීම සඳහා, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව.

උපලේඛනයේ දැක්වෙන දේපළ,

**වර්ෂ 2024ක් වූ මාර්තු මස 15 වැනි දින පෙ.ව. 11.30ට**

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ වෙත පිවිසීම.-*

කොළඹ කොටුව සිට තලාහේන හංදිය දක්වා කඩුවෙල පාර ඔස්සේ ගමන් කර එතනින් තැපැල් කණුව දක්වා විජය පාර ඔස්සේ මීටර් කිහිපයක් ගමන් කර හල්බරාව මාවතට වමට හැරී හල්බරාව පාර දක්වා මීටර් 150ක් ගමන් කර හල්බරාව පාරට දකුණට හැරී හල්බරාව 1 වන පටුමග දක්වා මීටර් 50ක් ගමන් කර හල්බරාව 1 වන පටුමගට දකුණට හැරී අඩි 16 පළල පාරක් දක්වා මීටර් 600ක් ගමන් කර දකුණට හැරී 16 වන පටුමග ඔස්සේ මීටර් 100 ක් ගමන් කර අවසානයේදී අඩි 12 පළල පුද්ගලික පාරකට වමට හැරී යාර කිහිපයක් ගමන් කළ විට දේපළ හමුවේ.

*ගෙවීම් කළ යුතු ආකාරය .-* විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය,
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් රු. 100/-,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1500/-,
(07) නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 3500/-,

*අනිකුත් තොරතුරු සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න* :

නීති දෙපාර්තමේන්තුව,
යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී.
අංක 64, ගාලුපාර,
කොළඹ 03.
දුරකතන අංකය 0112347100,

එල්. බී. සේනානායක
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක 7/1/10, 1 වන මහළ, සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංකය : 011-2396520.

02 - 710

---

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

(ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී හි අනුප්‍රාප්තික) ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් චාන්දනී දයාරත්න විසින් ලියා සහතික කරන ලද 2014.06.20 දිනැති අංක 8868 සහ 2015.05.07 දිනැති අංක 9676 දරන උකස් බැදුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, සිය ලියාපදිංචි කාර්යාලය මීගමුවේ පවත්වාගෙන යන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද PV 75121 දරන හොටෙල් රේන්බෝ (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින් ද,

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාශයේ, මීගමුව මහ නගර සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 158 වේල්ල වීදිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඒත්තුකාල වඩාත් නිවැරදිව කුඩාපාඩුව කැරන් පෙදෙස, වරිපනම් අංක 03 දරන ''පුනයිමරතඩිතෝට්ටම් *හෙවත්* දොඹගහවත්ත *හෙවත්* සී ඩ්‍රිෆ්ට්'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් සාදන ලද 2001.04.26 දිනැති අංක 2795 දරන එම මිනින්දෝරුවරයා විසින් 2014.04.08 නැවත සහතික කරන ලද පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි හතරයි දශම එකයි බිංදුවක් (රූ. 1, පර්. 24.10) *හෙවත්* හෙක්ටයාර් 0.6121 ක් විශාල ඉඩම එහි පිහිටි සියලු දේ ද සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ,

**2024 මාර්තු මස 13 වැනි දින පෙරවරු 9.30ට**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම*.- මීගමුව නගරයේ සිට වෙරළ පාර ඔස්සේ කි. මී. 1.5ක පමණ දුරක් ගොස් සාන්ත සෙබස්තියන් පිළිරුව දක්වා පැමිණ වම්පසට ඇති ලුවිස් පාරට හැරී තවත් මීටර් 600ක පමණ දුරක් ඉදිරියට ගොස් වම්පසින් පිහිටි කැරොන් පෙදෙස දක්වා පැමිණ එම මාර්ගයට පිවිස තවත් මීටර් 76ක පමණ දුරක් ගිය විට ''රේන්බෝ බීච් හොටෙල්'' නමැති අදාල දේපළ මාර්ග යේ වම්පසින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම*.- *රජයේ ගැසට් පත්‍රයේ* 2024.01.05 වන දින පළවී ඇති අතර දිවයින, ද අයිලන්ඩ් යන පුවත්පත්වල 2023.12.23 වන දින ද, තිනකුරල් පුවත්පතේ 2023.12.27 වැනි දින ද පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය* :- සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු වෙත පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000/-,
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 2,000/-
6. සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරියට ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු ය.

වැඩි විස්තර සඳහා විමසන්න.- අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය, ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02, දුරකථනය : 011-237171.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකාර,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකතන අංක : 011 3068185, 011 2572940

02 - 693

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ඩබ්ලිව්. ඒ. පී. අල්විස්.
ගිණුම් අංක : 1198 5484 6338

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.02.23 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි හැත්තෑ පන් ලක්ෂ පනස් හතර දහස් නවසිය හැටයි ශත විසි හතරක (රු. 17,554,960.24) මුදල ද, 2023 ජනවාරි 23 දින සිට හිමිකම් සහතිකපත් අංක 00052549765 හි ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඩී. එම්. විතානගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2022 අප්‍රේල් 22 දාතම හා එකී ප්‍රාථමික සහ අතිරේක උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අනූ හය ලක්ෂ හතලිස් හය දහසක (රු. 9,646,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහක් (12%) හා තවත් රුපියල් හැට පන් ලක්ෂ හතලිස් දහසක (රු. 6,540,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.04.06 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2023.04.10 දින සහ ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි,

**2024.03.21 වැනි දින ප.ව. 03.30 ට**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන්වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ කටුකැන්ද අංක 55A දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කටුකැන්ද ග්‍රාමයේ පිහිටි "කටුකැන්දවත්ත" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද බ්ලොක් 2හි කැඩැස්තර් සිතියම් අංක 510112හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට කැබලි අංක 72 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: ලොට් 73 සහ ලොට් 19, නැගෙනහිරට : ලොට් 19, දකුණට : ලොට් 57 සහ බස්නාහිරට : ලොට් 23, ලොට් 21 සහ ලොට් 73 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර දෙකයි දශම දෙකයි පහයි නමයයි හයක් (2.2596 Hectares) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී කැඩැස්තර සිතියම් අංක 510112ට අනුව ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 725

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

නවලෝක කන්ස්ට්‍රක්ෂන් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංකය : 0009 1000 5391

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.11.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැට එක් කෝටි හැත්තෑ දෙලක්ෂ හැට හත් දහස් නවසිය හැට දෙකයි ශත හතරක (රු. 617,267,962.04) මුදල ද, 2023.11.15 දින සිට අංක 4718 සහ 4720 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතළිස් එක් කෝටි පනස් ලක්ෂයක (රු. 415,000,000) මුදලක් සඳහා at the rate of Monthly Average Weighted Prime Lending Rate + Two per centum (AWPLR + 2%) per annum හා තවත් රුපියල් දෙකෝටි අසූ අට ලක්ෂ හතළිස් නව දහස් එකසිය හතළිස් දෙකයි ශත එකොළහක (රු. 28,849,142.11) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හයයි දශම නවයයි තුනක් (6.93%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.12.29 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2023.12.29 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි,

Lot A in plan No. 8439A - **2024.03.27 දින පෙ.ව. 09.00ට**
Lot A in plan No. 8040 - **2024.03.27 දින ප.ව. 03.00ට**

පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන්වන එන්. යූ. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

1. (i) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබොඩ පත්තුවේ, දොම්පේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ දොම්පේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ඉඟුරුගල්ල, අංක 389 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඉඟුරුගල්ල ග්‍රාමයේ පිහිටි "කොමිල්ල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ගාමිණී බී. දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2011 ඔක්තෝබර් 17 දාතම හා අංක 8439A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් D, නැගෙනහිරට : ලොට් D, දකුණට : ලොට් D සහ බස්නාහිරට : ඩී. එස්. ජයසිංහගේ ඉඩම සහ ලොට් D යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර, දෙකයි රූඩ් තුනයි, පර්චස් විසි හයක් (අක්. 2, රූ.3, පර්. 26.00) හෝ හෙක්ටයාර එකයි දශම එකයි හතයි අටයි හයක් (හෙක්. 1.1786) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 8439A දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 513/105 යටතේ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(ii) එකී ඉඟුරුගල්ල ග්‍රාමයේ පිහිටි "කොමිල්ල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ගාමිණී බී. දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2011 ඔක්තෝබර් 17 දාතම හා අංක 8439A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් D, නැගෙනහිරට : ඩී. ජී. රාජපක්ෂගේ ඉඩම, දකුණට : ලොට් D සහ බස්නාහිරට : ලොට් D යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි තුනක් (රූ.1, පර්. 23.00) හෝ හෙක්ටයාර බිංදුවයි දශම එකයි පහයි නවයයි තුනක් (හෙක්. 0.1593) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 8439A දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 513/106 යටතේ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(iii) එකී ඉඟුරුගල්ල ග්‍රාමයේ පිහිටි "කොමිල්ල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ගාමිණී බී. දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2011 ඔක්තෝබර් 17 දාතම හා අංක 8439A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් C වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් D, නැගෙනහිරට : ඩී. ජී. රාජපක්ෂගේ ඉඩම, දකුණට : ලොට් D සහ බස්නාහිරටː ඩී. එස්. ජයසිංහගේ ඉඩම සහ ලොට් D යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් අටක් (රූ. 3, පර්. 8.00) හෝ හෙක්ටයාර බිංදුවයි දශම තුනයි දෙකයි තුනයි හතක්(හෙක්. 0.3237) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 8439A දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 513/107 යටතේ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(iv) එකී ඉඟුරුගල්ල ග්‍රාමයේ පිහිටි "කොමිල්ල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ගාමිණී බී. දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2011 ඔක්තෝබර් 17 දාතම හා අංක 8439A දරන පිඹුරේ නිරූපිත (බලයලත් මානක තැන ගාමිණී බී. දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2019.08.26 පිටසන ප්‍රකාරව ඇතුළත් කරනු ලබන අංක 984 දරන පිඹුරේ ලොට් 6A) සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් D වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර, පී. ඒ. පෙරේරාගේ ඉඩම සහ ලොට් C , නැගෙනහිරට : පී. ඒ. පෙරේරාගේ, ඩී. ඒ. පොඩිඅප්පුහාමි සහ වෙනත් අයගේ සහ ඩී.ජී. රාජපක්ෂගේ ඉඩම් සහ ලොට් B, C සහ A, දකුණට : ලොට් B සහ C, ඩී. එස්. ජයසිංහගේ ඉඩම සහ ලොට් A සහ බස්නාහිරටː ඩී. එස්. ජයසිංහගේ ඉඩම්, බලයලත් මානක තැන එන්. පී. රණසිංහ යන අය විසින් සාදන ලද 2000.10.07 දාතම හා අංක 27/2000 දරන පිඹුරේ ලොට් 5A, ලොට් A, අංක 479 දරන එකී පිඹුරේ ලොට් 4, පාර (අංක 479 දරන එකී පිඹුරේ ලොට් 3) සහ පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර විසි හතයි රූඩ් දෙකයි පර්චස් විසි හතරක් (අ.27, රූ.2, පර්. 24.00) හෝ හෙක්ටයාර එකොළහයි දශම එකයි අටයි නවයයි හයක් (හෙක්. 11.1896) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 8439A දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 513/108 යටතේ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 4718 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, පෑලියගොඩ නගර සභා සීමාවන් තුළ සහ කැලණිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, ගඟබඩ, පෑලියගොඩ, අංක 174 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පෑලියගොඩ පිහිටි මීගමුව පාර, වරිපනම් අංක 214 දරන "හීනටිකුඹුර" යයි කිනු ලබන ඉඩමට බලයලත් මානක තැන ගාමිණී බී. දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2010

අගෝස්තු 26 දාතම හා අංක 8040 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මීගමුව පාර සහ මීගමුව පාර, වරිපනම් අංක 226 දරන පරිශ්‍රයන්, නැගෙනහිරට : පාර, දකුණට : දූටුගැමුණු මාවත සහ ලොට් B සහ බස්නාහිරට : ලොට් B සහ මීගමුව පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දොළහයි දශම හතරයි අටක් (රූ.3, පර්. 12.48) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 8040 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 182/37 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 4720 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 724

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

කේ. ඒ. කේ. සිරිවර්ධන *නොහොත්* කේ. කේ. සිරිවර්ධන
ගිණුම් අංකය : 0106 5000 0213

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.11.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි හැට පන් ලක්ෂ තිස් එක් දහස් එකසිය දහ හතරයි ශත පනස් නවයක (රු. 16,531,114.59) මුදල ද, 2023.11.24 දින සිට අංක 5122, 621, 1381A, 2138, 653, 309, 1011 සහ 1875 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ එක් ලක්ෂ හැත්තෑ අට දහස් පන්සියයක (රු. 7,178,500.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10%) හා තවත් රුපියල් අසූ තුන් ලක්ෂ පනස් පන් දහස් පන්සිය අසූ හයයි ශත එකක (රු. 8,355,586.01) මුදලක් සඳහා වාර්ෂිකව සියයට එකොළහක් (11%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2024.01.05 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2024.01.04 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි,

Lot $1^{B2}$, $1^{C2}$ - Plan No. 5533 - **2024.03.22 දින පෙ.ව. 10.30ට**
Lot A - Plan No. 1639 - **2024.03.22 දින පෙ.ව. 11.00ට**

පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන්වන එන්. යූ. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

1. (i) බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණ පස්දුන් කෝරළේ, ඉද්දගොඩ පත්තුවේ, මතුගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ මතුගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, ඕවිටගල (ග්‍රා. නි. අ. 795) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඕවිටගල පිහිටි පින්නගොඩ පාර, වරිපනම් අංක 14 දරන "නාරංගහවත්තේපිටකට්ටිය සහ නාරංගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. කේ. ටී. බද්දේවිතාන යන අය විසින් සාදන ලද 2021 සැප්තැම්බර් 30 දාතම හා අංක 5533 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් $1^{B2}$ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් $1^{B1}$, නැගෙනහිරට : නාරංගහවත්ත, දකුණට : අංක 3245 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම එකයි දෙකක් (පර්. 18.12) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 5533 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් $1^{B2}$ පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී ඕවිටගල පිහිටි පින්නගොඩ "නාරංගහවත්තේපිටකට්ටිය සහ නාරංගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එල්. ෆොන්සේකා යන අය විසින් සාදන ලද 2003 ජනවාරි 21 දාතම හා අංක 3401 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : නාරංගහවත්ත, නැගෙනහිරට : නාරංගහවත්ත, දකුණට: බලයලත් මානක තැන ඩී. පී. රාජපක්ෂ විසින් සාදන ලද 1955.10.06 දාතම හා අංක 3245 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට: මෙහි ලොට් 1A සහ 1C යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (පර්. 20) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 3401 දරන පිඹුරට අනුව ඔප්පුව අංක A 273/19 යටතේ මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(ii) එකී ඕවිටගල පිහිටි පින්නගොඩ පාර, වරිපනම් අංක 14 දරන "නාරංගහවත්තේපිටකට්ටිය සහ නාරංගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. කේ. ටී. බද්දේවිතාන යන අය විසින් සාදන ලද 2021 සැප්තැම්බර් මස 30 දාතම හා අංක 5533 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් $1^{C2}$ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් $1^{A2}$ සහ $1^{A1}$, නැගෙනහිරට : ලොට් $1^{B2}$, දකුණට : අංක 3245 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට: පාර සහ ලොට් $1^{C1}$ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි එකයි දශම පහයි හතක් (පර්. 21.57) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 5533 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් $1^{C2}$ පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී ඕවිටගල පිහිටි "නාරංගහවත්තේපිටකට්ටිය සහ නාරංගහවත්ත" යයි කියනු ලබන ඉඩමට අංක 3401 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1C වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : මෙහි ලොට් 1A, නැගෙනහිට : මෙහි ලොට් 1B, දකුණට : බලයලත් මානක තැන ඩී. පී. රාජපක්ෂ විසින් සාදන ලද 1955.10.06 දින හා අංක 3245 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකක් (පර්. 22.0) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 3401 දරන පිඹුරට අනුව ඔප්පුව අංක A 273/20 යටතේ මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 3401 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් A1 වශයෙන් ලකුණුකොට ඇති මාර්ග වෙන්කිරීම දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 5122, 621, 1381A, 2138 සහ 653 යන උකස් බැඳුම්කර මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බටහිර පස්දුන් කෝරළේ, ඉද්දගොඩ පත්තුවේ, මතුගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ මතුගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, ඕවිටගල 795 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නාරවිල සහ ගනේගම ග්‍රාමයේ පිහිටි "මද්දේගෙදර එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට (සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද 1976 පෙබරවාරි 17 දාතම හා අංක P. P. 1946 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 හා සමාන නැවත මිනුමක් වන) බලයලත් මානක තැන ඩී. කේ. ටී. බද්දේවිතාන යන අය විසින් සාදන ලද 2013 ජූලි 02 සහ 09 දාතම හා අංක 1639 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: මෙම ඉඩමේ කොටසක්, නැගෙනහිරට : මෙම ඉඩමේ කොටසක්, දකුණට : පාර සහ බස්නාහිරට : සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද 1976 පෙබරවාරි 17 දාතම හා අංක P. P. 1946 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 හි ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් විසි නවයයි දශම එකයි අටක (අ.2, රූ.1, පර්. 29.18) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 1639 දරන පිඹුරට අනුව ඔප්පුව අංක A 44/130 යටතේ මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 309, 1011 සහ 1875 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 723

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ෆන්ට්ලයින් පා(ර්)ක් රෙසිඩන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංකය : 0027 1001 4747

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.11.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසි දෙකෝටි පනස් නව ලක්ෂ හැට හතර දහස් තුන්සිය පනස් එකයි ශත නමයක (රු. 225,964,351.09) මුදල ද, 2023.11.08 දින සිට අංක 6146 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දස කෝටි නව ලක්ෂ දහ තුන් දහසක (රු. 100,913,000) මුදලක් සඳහා at the rate of Monthly Average Weighted Prime Lending Rate + Three decimal Five per centum (AWPLR + 3.5%) per annum හා තවත් රුපියල් හත් කෝටි හැත්තෑ ලක්ෂ අසූ පන් දහස් විසි එකයි ශත හැත්තෑ එකක (රු. 77,085,021.71) මුදලක් සඳහා at the rate of Monthly Average Weighted Prime Lending Rate + Three decimal Five per centum (AWPLR + 3.5%) per annum හා තවත් රුපියල් හැට හය ලක්ෂයක (රු. 6,600,000) මුදලක් සඳහා at the rate of Monthly Average

Weighted Prime Lending Rate + Three decimal Five per centum (AWPLR + 3.5%) per annum හා තවත් රුපියල් එක් කෝටි විසි පන් ලක්ෂයක (රු. 12,500,000.00) මුදලක් සඳහා at the rate of Monthly Average Weighted Prime Lending Rate + Three decimal Five per centum (AWPLR + 3.5%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.12.29 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2023.12.29 දින සහ ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි,

**2024.03.06 වැනි දින ප.ව. 03.00 ට**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, වැල්ලවත්ත උතුර අංක 21 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, කොළඹ 06, තිඹිරිගස්යාය පිහිටි ගුණතිලක ඇවනිව්, වරිපනම් අංක 16 දරන ඉඩමට බලයලත් මානක තැන ඒ. ආර්. සිල්වා යන අය විසින් සාදන ලද 2014 ඔක්තෝබර් මස 03 දින හා අංක 5680/C දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ගුණතිලක ඇවනිව්, ගුණතිලක ඇවනිව්, වරිපනම් අංක 05 දරන පරිශ්‍රයන් සහ සිමෙන්ති කානුව, නැගෙනහිරට : කිරුළපන ඇළ, දකුණට: එස්තර් ඇවනිව්, වරිපනම් අංක 15 සහ 11 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : ගුණතිලක ඇවනිව්, වරිපනම් අංක 04 දරන පරිශ්‍රයන් සහ ගුණතිලක ඇවනිව් සහ ගුණතිලක ඇවනිව්, වරිපනනම් අංක 05 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහතුනයි දශම පහයි හතක් (රූ.1, පර්. 13.57) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 5680/C දරන පිඹුරට අනුව ය.

එකී ලොට් A පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

(*ඊ*) හිමිකම් සහතික අංකය : 00362543902
(*එෆ්*) හිමිකම් පන්තිය : පළමු

*01. ගෙවීම් ක්‍රමය* - ගැණුම්කරු ලංසුව සාර්ථකවීමෙන් අනතුරුව පහත සඳහන් පරිදි මිල ගණන් මුදලින් ගෙවිය යුතු වේ :

1.1 ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) එම අවස්ථාවේම ගෙවිය යුතුය,
1.2 වැට් බදු ගාස්තු ද,
1.3 විකුණුම් බදු වශයෙන් 1% ක (සියයට එකක්) බද්දක් පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතුය,
1.4 වෙන්දේසිකාර කොමිස් මුදල් හා අනෙකුත් ගාස්තු වශයෙන් 2.5% ක් (සියයට දෙකහමාරක්),
1.5 අදාල වේ නම් විකුණුම් වියදම් හා අනෙකුත් ගාස්තු,
1.6 අනෙකුත් ගාස්තු හා වියදම් ද,

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැණුම් මිළෙන් තවත් 10% (සියයට දහයක්) ගෙවිය යුතු අතර විකුණුම් දිනයේ සිට මාස තුනක් (03) ඇතුළත ගැනුම් මිලේ ඉතිරි 80% ගෙවිය යුතුය. මීට අමතරව ගැණුම්කරු මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි හා විකුණුම් සහතිකය සහතික කිරීමේ නොතාරිස් ගාස්තු ගෙවිය යුතුය.

ඉහත සඳහන් කොන්දේසි හා ගැණුම්කරු එකගවීම ට අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේ ගෙවන ලද සියලුම මුදල් පවරාගැනීමේ හා දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුය.

2. *දේපළ වෙත ප්‍රවේශ මාර්ගය* - ගෙලිඔය නගරයේ සිට දව්ලගල පාරේ කි.මී. 4.0 ක් පමණ ගමන් කර වේගිරිය පාරට දකුණට හැරී ගල්කොන හන්දිය දක්වා කි.මී. 1/2 ක් පමණ ගමන්කර බටුපිටිය පාරට වමට හැරී මීටර් 150ක් පමණ ගියවිට දේපළ පිහිටා ඇත.

"ඉහත දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන ලංසුකරුවන් හට නිදහසේ පරීක්ෂා කිරීමට නාවලපිටිය ශාඛාවේ කළමනාකාර මහතා වෙත දු.ක. 054-2222233 මගින් ඇමතීමෙන පරීක්ෂා කළ හැක.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

ඩී.එම්. පී. දිසානායක,
කළමනාකරු.

ලංකා බැංකුව,
නාවලපිටිය ශාඛාව.

02 - 689

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

01. ණය යොමු අංකය : 81984288.

වට්ටප්පොළ, වලගෙදර, අංක 130/B/1 හි එච්. බී. අයි. සී. හේරත් මහතා විසින් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයට අනුකූලව සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2023.10.13 සිකුරාදා දිනැති අංක 2354 දරන *ගැසට් පත්‍රයේ* හා 2023.10.12 වැනි බ්‍රහස්පතින්දා දින ''දිනමිණ'', ''ඩේලි නිව්ස්'', හා "තිනකරන්'' යන පුවත්පත්වල පළකරන ලද දැන්වීම් අනුව මුල් ණය මුදලේ ශේෂය හා විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය එකී ස්ථානයේ දී ම,

**2024 මාර්තු මස 05 වැනි අඟහරුවාදා දින පෙ. ව. 11.30 ට**

කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි M/S ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කඳු පළාත කෝරලේ, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලගෙදර ග්‍රාම සේවා කොට්ඨාසයේ, වලගෙදර ග්‍රාමයේ පිහිටි "ගොරොකගහකොටුවේ වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. බී. ලංසකාරනායක විසින් සාදන ලද 1998.10.06 සහ 1999.02.25 දිනැති අංක 2198 දරන පිඹුරෙහි ලොට් 1A ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : අගල ද, නැගෙනහිරටඃ ගංහත සිට ප්‍රධාන පාර දක්වා පාර ද, දකුණට : ලොට් 1B ද, බස්නාහිරටඃ පරනපට්ටියේ සිට ගඩලාදෙනිය දක්වා ප්‍රධාන පාර හරහා යන ඇළ ද මායිම්ව රූඩ් දෙකයි පර්චස් හතයි දශම දෙකක (රූ.2, පර්. 7.2) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, ආදී සියලු දේ ද වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි

කිරීමේ කාර්යාලයේ C 401/123 හි ලියාපදිංචි කර ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කඳු පළාත කෝරළේ, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලගෙදර ග්‍රාම සේවා කොට්ඨාසයේ, වලගෙදර ග්‍රාමයේ පිහිටි "ගොරොකගහකොටුවෙ වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. බී. ලංසකාරනායක විසින් සාදන ලද 1998.10.06 සහ 1990.02.25 දිනැති අංක 2198 දරන පිඹුරෙහි ලොට් 1B ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : ලොට් 1A ද, නැගෙනහිරට : ගංහත සිට ප්‍රධාන පාර දක්වා දිවෙන පාර ද, දකුණට : මානපැලේ වත්ත ද, බස්නාහිරට : කොටකුඹුර ඇළ ද මායිම්ව රූඩ් දෙකයි පර්චස් හතයි දශම දෙකක (රූ.2, පර්. 7.2) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස්, ගහකොළ, ආදී සියලු දේ ද වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 401/124 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම් මැතක දී ඒකාබද්ධ කොට ඇති අතර පහත සඳහන් ආකාරයට විස්තර කොට ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කඳු පළාත කෝරළේ, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලගෙදර ග්‍රාම සේවා කොට්ඨාසයේ, වලගෙදර ග්‍රාමයේ පිහිටි "ගොරොකගහකොටුවෙ වත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. බී. ලංසකාරනායක විසින් සාදන ලද 2017.03.14 දිනැති අංක 8764 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල , උතුරට : අගල ද, නැගෙනහිරට : ගංහත සිට ප්‍රධාන පාර දක්වා පාර ද, දකුණට : මානපැලේ වත්ත ද, බස්නාහිරටː පරණ පට්ටිය සිට ගඩලාදෙනිය දක්වා ප්‍රධාන පාර ද, කොටකුඹුර ඇළ ද, මායිම්ව අක්කර එකයි පර්චස් දාහතරයි දශම හතරක (අ.1, පර්. 14.4) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගස් ආදී සියල්ල සමග වේ.

*ගෙවීම් ක්‍රමය* - ගැණුම්කරු ලංසුවෙන් අනතුරුව පහත සඳහන් පරිදි මිල ගණන් මුදලින් ගෙවිය යුතුය.

(01) මිලදී ගන්නා මිලෙන් 10% (සියයට දහයක්) එම අවස්ථාවේම ගෙවිය යුතුය,

(02) වැට් බදු ගාස්තු ද,

(03) විකිණුම් බදු වශයෙන් 1% ක (සියයට එකක්) බද්දක් පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතුය,

(04) වෙන්දේසිකාර කොමිස් මුදල් හා අනෙකුත් ගාස්තු වශයෙන් 2.5% ක් (සියයට දෙකහමාරක්),

(05) අදාළ වේ නම් විකුණුම් වියදම් හා අනෙකුත් ගාස්තු,

(06) අනෙකුත් ගාස්තු හා වියදම් ද,

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු අතර වියදම් දිනයේ සිට මාස තුනක් (03) ඇතුළත ගැනුම් මිලේ ඉතිරි 80% ගෙවිය යුතු මීට අමතරව ගැනුම්කරු මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි හා විකුණුම් සහතිකය සහතික කිරීමේ නොතාරිස් ගාස්තු ගෙවිය යුතුය.

ඉහත සඳහන් කොන්දේසි හා ගැණුම්කරු එකගවීම ට අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේ ගෙවන ලද සියලුම මුදල් පවරාගැනීමේ හා දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුය.

2. *දේපළ වෙත ප්‍රවේශ මාර්ගය* - පිළිමතලාව නගරයේ සිට ගඩලාදෙණිය පාරේ, ගඩලාදෙණිය හන්දිය තෙක් කි.මී. 1.1ක් පමණ දුරක් ගමන්කර වට්ටප්පොල පාර දෙසට දකුණට හැරී කි.මී. 5ක් පමණ ගියවිට වම්පැත්තේ සෘජු පැහැදිලි නීත්‍යානුකූලව රථවාහන ගමන් කළහැකි පාරට ඉදිරියෙන් පිහිටා ඇත. (දේපළ වට්ටප්පොල ප්‍රාථමික විදුහල පසුකර මීටර් 75ක් පමණ දුරින් පිහිටා ඇත.)

"ඉහත දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන ලංසුකරුවන් හට නිදහසේ පරීක්ෂා කිරීමට පිළිමතලාව ශාඛාවතුළ ඇත. දු.ක. අංක 081 2577151/081 2579600 ඇමතීමෙන් පරීක්ෂා කළ හැක.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

ආර්. ඩබ්. ඒ. එම්. එස්. පී. කුමාරිහාමි,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
පිළිමතලාව ශාඛාව.

02 - 688

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන පනතින් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

01. ණය යොමු අංකය : 81906457, 81906658, 84315852, 84325966, 84976845, 85942185.

පානදුර, කෙසෙල්වත්ත, ගොරකාන, ගාලුපාර, අංක 374/4, හි පිහිටි රාෂි ලේක් රිසෝර්ට් විසින් උකස් කරන ලද දේපළ විකිණීම.

තනි අයිතිකරු - පානදුර, පෙරේරා මාවත, අංක 14B, හි සකලසූරිය ආරච්චිගේ දෝන පුන්සිසි හර්ෂනී පෙරේරා මහත්මිය.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයකට අනුකූලව සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2023.12.01 වැනි දිනැති අංක 2361 දරන *ගැසට් පත්‍රයේ* හා 2023.11.29 වැනි බදාදා දින ''දිනමිණ'', ''ඩේලි නිව්ස්'', හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළකරන ලද දැන්වීම් අනුව මුල් ණය මුදලේ ශේෂය හා විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය එකී ස්ථානයේ දී ම,

**2024 මාර්තු මස 22 වැනි දින පෙ. ව. 10.00 ට**

කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර මුදුගමුවේ හේවාවසම් තුසිත් කරුණාරත්න විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්ද හි පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ (කෙසෙල්වත්ත උප කාර්යාලය) ගොරකාන අංක 671 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගොරකාන හි පිහිටි කොළඹ පාරේ වරිපනම් අංක 374/4 දරන ''කෝන්ගහවත්ත ජම්බුගහවත්ත රටවරකගහවත්ත සහ මිටිඅඹගහවත්ත '' නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. පී. ලියනගේ විසින් සාදන ලද 2018 ඔක්තෝබර් 28 දිනැති අංක 2033 දරන පිඹුරේ ලොට් X ලෙස ලකුණු කර නිරූපනය කළ බෙදන ලද්දවූ විස්තර කළ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් X උතුරට : අංක 1090A දරන පිඹුරෙහි ලොට් 1හි ඉතිරි කොටස ද, අඩි 12 ක් පළල පාර ද, මාරගහවත්ත ද, බොල්ගොඩ ගඟ ද, නැගෙනහිරට : බොල්ගොඩ ගඟ ද, දකුණට : අඩි 4670 දරන පිඹුරේ රටවරකගහවත්ත ද, බස්නාහිරට : අංක 2723 දරන පිඹුරේ ලොට් D ද අංක 1090A දරන පිඹුරේ ලොට් 1හි ඉතිරි කොටස ද, අඩි 12ක් පළල පාර ද, මාරගහවත්ත ද, මායිම්ව ඉහත සඳහන් අංක 2033 දරන පිඹුර අනුව බලයලත් මිනින්දෝරු එල්. පී. ලියනගේ විසින් සාදන ලද 2009 නොවැම්බර් 02 දිනැති අංක 31 දරන පිඹුරේ ලොට් 2 ලෙස මායිම් නිරූපනය කළ, නැගෙනහිර දෙස මායිමෙන් (මෙම ඉඩමේ පර්චස් තිස්එකයි දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 31.5) හැර) අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් බිංදුවයි දශම හයයි තුනක් (අ. 1, රූ. 2, පර්. 0.63) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම වේ. මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D469/83හි ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

1. ඉහත කී පරිදි ගොරකාන හි පිහිටි ''කෝන්ගහවත්ත ජම්බුගහවත්ත රටවරකගහවත්ත (ඔප්පුව අනුව කෝන්ගහවත්ත ජම්බුගහවත්ත රටවරකගහවත්ත සහ මිටිඅඹගහවත්ත *හෙවත්* කෝන්ගහවත්ත'' නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ආර්. බී. සිල්වා විසින් සාදන ලද 1971 ජුනි 23 දිනැති අංක 2723 දරන පිඹුරේ මායිම් නිරූපනය කළ ලොට් H ලෙස ලකුණු කර බෙදන ලද්ද වූ විස්තර කළ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් H, උතුරට : එම ඉඩමේ ලොට් A, B, C, D, E සහ F ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් G ද, දකුණට : කලින් ඒ. ආර්. පෙරේරාට අයිති වර්තමානයේ උපාලි පෙරේරාට හිමි ඉඩම ද, බස්නාහිරට : කොළඹ ගාලු පාර ද මායිම්ව එකී අංක 2723 දරන පිඹුර අනුව පර්චස් විසිනවයක් (අ. 0, රූ. 0, පර්. 29) බිම් ප්‍රමාණයකින් යුත් ඉඩම වේ. මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D469/84හි ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී පරිදි ගොරකාන හි පිහිටි ''මිටිඅඹගහවත්ත *හෙවත්* කෝන්ගහවත්ත (ඔප්පුව අනුව කෝන්ගහවත්ත ජම්බුගහවත්ත රටවරකගහවත්ත සහ මිටිඅඹගහවත්ත *හෙවත්* කෝන්ගහවත්ත '' නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. පී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1977 අගෝස්තු 25 දිනැති අංක 445 දරන පිඹුරේ මායිම් නිරූපනය කළ ලොට් 9 ලෙස ලකුණු කර බෙදන ලද්දා වූ විස්තර කළ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 9, උතුරට : එම ඉඩමේම ලොට් 2, 5, 7, 11, 12 සහ 13 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 3, 4, 5, 8, 11 ද, අකුලුඑළිය ගඟ ද, දකුණට : ලොට් 8, 18, 14 සහ ජී. එල්. ෆොන්සේකාට අයිති ඉඩම ද, බස්නාහිරට: ලොට් 1 5, 6 සහ ප්‍රධාන පාර ද, මායිම්ව එකී අංක 445 දරන පිඹුර අනුව පර්චස් විස්සයි දශම පහක් (අ. 0. රූ. 0. පර්. 20.5) බිම් ප්‍රමාණයකින් යුත් ඉඩම වේ. මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D469/112හි ලියාපදිංචි කර ඇත.

*ගෙවීමේ ක්‍රමය* - ගැණුම්කරු ලංසුවෙන් අනතුරුව පහත සඳහන් පරිදි මිල ගණන් මුදලින් ගෙවිය යුතුය :

(01) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) එම අවස්ථාවේම ගෙවිය යුතුය,

(02) වැට් බදු ගාස්තු ද,

(03) විකිණුම් බදු වශයෙන් 1% ක (සියයට එකක්) බද්දක් පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතුය,

(04) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් හා අනෙකුත් ගාස්තු වශයෙන් 2.5% ක් (සියයට දෙකහමාරක්),

(05) අදාළ වේ නම් විකුණුම් වියදම් හා අනෙකුත් ගාස්තු,

(06) අනෙකුත් ගාස්තු හා වියදම් ද,

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැණුම් මිලෙන් තවත් 10% (සියයට දහයක්) ගෙවිය යුතු අතර විකුණුම් දිනයේ සිට මාස 03 ක් ඇතුළත ගැණුම් මිලේ ඉතිරි 80% ගෙවිය යුතුය. මීට අමතරව ගැණුම්කරු මුද්දර ගාස්තු, නොතාරිස් ගාස්තු සහ විකුණුම් කොන්දේසි හා විකුණුම් සහතිකය සහතික කිරීමේ ගාස්තු ද ගෙවිය යුතුය.

ඉහත සඳහන් කොන්දේසි හා ගැණුම්කරු එකගවීම ට අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේ ගෙවන ලද සියලුම මුදල් පවරා ගැනීමේ හා දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුය.

2. *දේපළ වෙත ප්‍රවේශ මාර්ගය* - මොරටුව දිගරොල්ල පාලමේ සිට පරණ ගාලු පාරේ මීටර් 500ක් පමණ දුර කි.මී. 21 වන කි. මී. කණුව තෙක් ගමන් කර ඉදිරියෙන් දකුණට හැරී අඩි 20ක් පළල පුද්ගලික පාරේ "රාෂී ලේක් රිසෝර්ට්" නාම පුවරුවට මීටර් 50ක් ගියවිට පාර අවසානයේ අදාළ ඉඩම පිහිටා ඇත.

"ඉහත දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන ලංසුකරුවන් හට නිදහසේ පරීක්ෂා කිරීමට මොරටුව, අධිශ්‍රේණි ශාඛාවේ කළමනාකාර මහත්මිය වෙත දු.ක. 011 2644161, 0112645427 මගින් ඇමතීමෙන් පරීක්ෂා කළ හැක.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

එන්. සී. අක්මීමන,
ප්‍රධාන කළමනාකාරිණී.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මොරටුව

02 - 675

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

01. ණය යොමු අංකය : 83449947, 83450293 සහ 83450434

මහනුවර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, අංක 640/09 හි ජයසිංහ ආරච්චිගේ මංගලිකා ජයසිංහ යන අය විසින් උකස්කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයකට අනුකූලව සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2023.12.22 වැනි දිනැති අංක 2364 දරන *ගැසට් පත්‍රයේ* හා 2023.12.19 වැනි අඟහරුවාදා දින ''දිනමිණ'', ''ඩේලි නිව්ස්'', හා "තිනකරන්'' යන පුවත්පත්වල පළකරන ලද දැන්වීම් අනුව මුල් ණය මුදලේ ශේෂය හා විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම,

**2024 මාර්තු මස 21 වැනි බ්‍රහස්පතින්දා දින පෙ. ව. 10.00 ට**

කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි M/S ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර එම්. එච්. ටී. කරුණාරත්න විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමු උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා මහනුවර මහ නගර සභා සීමාවේ, ගඟවට කෝරළයේ, වලාට ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, වෝඩ් අංක 2 වලාට හි පිහිටි "තලඋයන් වත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු සී. පාලම්කුඹුර විසින් සාදන ලද 2010 පෙබරවාරි 22 දිනැති අංක 4952 දරන පිඹුරේ මායිම් නිරූපණය කර ලොට් අංක 01 ලෙස ලකුණු කළ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් අංක 01, උතුරට : අංක 919 දරන පිඹුරේ ලොට් 03 ද; නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් අංක 2 ද; දකුණට: අංක 919 දරන පිඹුරේ ලොට් බී 2 ද; බස්නාහිරට: සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ, වරිපනම් අංක 652/2 දරන පරිශ්‍රය ද මායිම්ව රූඩ් එකයි පර්චස් තුනක් හෝ හෙක්ටයාර බිංදුවයි දශම එකයි බිංදුවයි අටයි හතයි හයක් (හෙක්ටයාර 0.10876)ක බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A588/35 හි ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා මහනුවර මහ නගර සභා සීමාවේ, ගඟවට කෝරළයේ, වලාට ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, වලාට හි පිහිටි "තලඋයන් වත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු සී. පාලම්කුඹුර විසින් සාදන ලද 2010 පෙබරවාරි 22 දිනැති අංක 4952 දරන පිඹුරේ මායිම් නිරූපණය කර ලොට් අංක 02 ලෙස ලකුණු කළ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් අංක 02, උතුරට : අංක 919 දරන පිඹුරේ ලොට් B3 ද; නැගෙනහිරට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, වරිපනම් අංක 664 හා 664/1 දරන පරිශ්‍රය ද; දකුණට : අංක 919 දරන පිඹුරේ X-Y-Z ලෙස ලකුණු කළ ධාවන පථය සහ අඩි 15ක් පළල Z-Z1,

මාර්ගය ද, බස්නාහිරට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ, වරිපනම් අංක 652/2 සහ අංක 4952 දරන පිඹුරේ ලොට් අංක 1 මායිම්ව පර්චස් අටක් හෝ හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි දෙකයි බිංදුවයි දෙකක් (හෙක්ටයාර 0.0202)ක බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 660/115 හි ලියාපදිංචි කර ඇත.

3. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා මහනුවර මහ නගර සභා සීමාවේ, ගඟවට කෝරළයේ, වලාට ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, වලාට හි පිහිටි "තලඋයන් වත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු සී. පාලම්කුඹුර විසින් සාදන ලද 2010 පෙබරවාරි 22 දිනැති අංක 4952 දරන පිඹුරේ මායිම් නිරූපණය කර ලොට් අංක 03 ලෙස ලකුණු කළ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් අංක 03, උතුරට : මාබල් කුරේ මාවත ද; නැගෙනහිරට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, වරිපනම් අංක 642/2 දරන පරිශ්‍රය ද, දකුණට: සිරිමාවෝ බණ්ඩාරනායක මාවත වරිපනම් අංක 664 සහ 644/1 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 2 සහ අංක 919 දරන පිඹුරේ ලොට් බී 3 ද මායිම්ව රූඩ් එකයි පර්චස් එකයි දශම අටයි හතක් (රූ.1, පර්. 1.87) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 660/116 හි ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළයේ, ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා මහනුවර මහ නගර සභා සීමාවේ, වලාට ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, පේරාදෙනිය පාරේ වර්තමානයේ සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ පිහිටි "තලඋයන් වත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු සී. පාලම්කුඹුර විසින් සාදන ලද 1980 අගෝස්තු 14 දිනැති අංක 919 දරන පිඹුරේ X-Y-Z-Z 1 ලෙස මායිම් නිරූපණය කළ අඩි 15ක් පළල ප්‍රවේශ මාර්ගය උතුරට : එකී පිඹුරේ ලොට් B1 සහ ලොට් B2 සහ ලොට් C ද; නැගෙනහිරට : එකී පිඹුරේ වරිපනම් අංක 644 දරන පරිශ්‍රය, එකී පිඹුරේ ලොට් B 2 සහ ලොට් C ද; දකුණට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, ලොට් B2 සහ ලොට් C ද; බස්නාහිරට : ලොට් C සහ B2 ද මායිම්ව පර්චස් විසිහතරයි දශම දෙකයි පහක් (පර්. 24.25) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 452/130 හි ලියාපදිංචි කර ඇත.

"ඉහත දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන 2024 පෙබරවාරි මස 27 වැනි දින සිට දු.ක. අංක 066 2256580 මගින් ඇමතීමෙන් ලංසුකරුවන් හට නිදහසේ පරීක්ෂා කිරීම සඳහා ශාඛාවේ තබා ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. එස්. එස්. කේ. ගමගේ,
කළමනාකරු.

2024 පෙබරවාරි මස 02 වැනි දින,
ලංකා බැංකුව,
බකමූණ ශාඛාව.

02 - 676

---

**ලංකා බැංකුව**

## 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

01. ණය පහසුකම් යොමු අංකය : 80057867.

හිඟුරක්ගොඩ, පුලතිසිගම, අංක 62 හි නාලිකා දමයන්ති හෙට්ටිආරච්චි මහත්මියට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018.10.05 වැනි දිනැති අංක 2092 දරන *ගැසට් පත්‍රයේ* හා 2018.09.25 වැනි සිකුරාදා දින ''දිනමිණ'', ''ඩේලි නිව්ස්'', හා "තිනකරන්'' යන පුවත්පත්වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම,

**2024 මාර්තු මස 15 වැනි සිකුරාදා දින ප. ව. 12.30 ට**

කොළොන්නාව, විහාර මාවතේ, අංක 182/3 (50/) හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ අංක 04 සිදරංගල කොට්ඨාසයේ සිංහල පත්තුවේ අංක 75 දරන පුලතිසිගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හිඟුරක්ගොඩ ග්‍රාමයේ පිහිටි "දමන මූකලා *හෙවත්* ජෝන්කොලොස්වත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු අයි. එච්. එම්. එස්. ජේ. බී. හේරත් විසින් සාදන ලද 2012.04.03 වැනි දිනැති අංක 1405 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල් එනම්, එකී ලොට් 2, උතුරට : ලොට් අංක F.C.P. PO. 132 හි ලොට් 319 සහ 267 ද, නැගෙනහිරට : F.C.P. PO. 132 හි ලොට් අංක 267 ද, දකුණට : අංක 1405 දරන පිඹුරෙහි ලොට් අංක 01 ද, බස්නාහිරට : F.C.P. PO. 132 හි ලොට් අංක 319 සහ අංක 1405 දරන පිඹුරෙහි ලොට් අංක 1 ද මායිම්ව පර්චස් පහළොවක (පර්.15) *හෙවත්* හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි හතයි නවයක (හෙක්ටයාර 0.0379) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මේ සමග මෙයට එකී ලොට් අංක 2 සඳහා ඇති මාර්ග භාවිතයට අයිතිය ද සමග එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා වෙනත් සියලු දේ ද අයිති වේ. මෙය පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G/4/145 හි ලියාපදිංචි කර ඇත.

"ඉහත දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන හිඟුරක්ගොඩ ශාඛාවේ 2024 මාර්තු මස 15 වැනි දින 027 2246574 සමග දුරකථන අංකයෙන් සම්බන්ධ වී පරීක්ෂා කිරීමට ලංසුකරුවන්ට නිදහස ඇත."

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. සී. ඩී. කේ. ඒකනායක,
කළමනාකරු.

2024 පෙබරවාරි මස 05 වැනි දින,
ලංකා බැංකුව,
හිඟුරක්ගොඩ.

02 - 727

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

01. ණය පහසුකම් යොමු අංකය : 82146184.

හෙට්ටිපොල, රිට්ටාදෙනිය පදිංචි හේරත් මුදියන්සේලාගේ පද්මසිරි බංඩාර හේරත් මහතා සහ කිරුලපන විතාරනගේ චමරි ජයෝමි රත්නායක මහත්මියට අයත් උකස්කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2023.04.28 වැනි දිනැති අංක 2330 දරන *ගැසට් පත්‍රයේ* හා 2023.05.10 වැනි දින ''දිනමිණ'', ''ඩේලි නිව්ස්'', හා "තිනකරන්'' යන පුවත්පත්වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම,

**2024 මාර්තු මස 06 වැනි දින පෙ. ව. 11.00 ට**

කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, කරඳාපත්තු කෝරළේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාවේ සහ පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1413 දහනැක්ගෙදර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හොරොම්බුව ග්‍රාමයේ කොන්තරාදුහේන, ගොඩයායෙහේන, සහ කොන්තරාදුහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් සාදන ලද 2006 මාර්තු 15 වැනි දිනැති අංක 1673 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තරකොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : F.V.P. 2110 හි ලොට් 61 හා 62 ද, නැගෙනහිරට : ලොට් 62 හා පාර (එම ඉඩමේ ම කොටස ද), දකුණට : පාරට වෙන්කළ කොටස දැන් ප්‍රාදේශීය සභා පාර සහ උදය හිමිකම් කියන ඉඩම් ද, බස්නාහිරට : අකරවත්ත ගමේ මායිම සහ උදය විසින් හිමිකම් කියන ඉඩම ද යන මායිම් තුළ පිහිටි අක්කර හයයි රූඩ් දෙකයි, පර්චස් දාහතරක (අ.6, රූ.2, පර්.14) ඉඩම සහ ඒ තුළ පිහිටි වෙනත් සියලු දේත් වේ. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q20/117හි ලියාපදිංචි කර ඇත.

ඉහත දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන කුලියාපිටිය අධිශ්‍රේණි ශාඛාවේ කළමනාකාරිණී සමග 037 - 2288180 දුරකථන අංකයෙන් සම්බන්ධ වී පරීක්ෂා කිරීමට ලංසුකරුවන්ට නිදහස ඇත.

*ගෙවීම් කරන ආකාරය* - සාර්ථක ගැණුම්කරුට පහත සඳහන් මුදල්, මිටිය පහත හෙළන අවස්ථාවේ දී මුදලින් ගෙවීමට සිදුවේ :

(01) මිලදී ගන්නා මිලෙන් 10% (සියයට දහයක්) ද,
(02) වැට් අයකර ගැනීම් (අදාළ නම්) ද,
(03) විකුණුම් බද්ද ලෙස ප්‍රාදේශීය පාලන අධිකාරියට 1% (සියයට එකක්) ද,
(04) වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස 2.5% (සියයට දෙකයි දශම පහක්) ද,
(05) විකුණුම් පිරිවැය සහ අදාළ වෙතොත් වෙනත් ඕනෑම ගාස්තුවක්,
(06) ගාස්තු හා වෙනත් අයකර ගැනීම් ද,

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැණුම් මිලෙන් තවත් 10% (සියයට දහයක්) ගෙවීමට සිදුවේ. මිලදී ගත් මිලේ ඉතිරි 80% වෙන්දේසි දිනයේ සිට මාස තුනක් ඇතුළත ද පියවිය යුතුය. මුද්දර බද්දක් සහ විකුණුම් තත්ත්වය සහතික කිරීම සහ විකුණුම් සහතික සඳහා නොතාරිස් ගාස්තුවක්.

ඉහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට ගැණුම්කරු අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේ දී ගෙවන ලද සියලු මුදල් අහිමිකර දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

ඒ. ඒ. එල්. අබේසිංහ,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී

ලංකා බැංකුව,
කුලියාපිටිය අධිශ්‍රේණි ශාඛාව.

02 - 677

---

## නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මාලිගාතැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා පළාත් පාලන ආයතනයේ, ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාතහේවාහැට ගංදහය කෝරළේ, ගුරුදෙනිය සහ ගෝනවත්ත ග්‍රාමයන්හි පිහිටා ඇත්තා වූ ද, හරගම එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා (බලයලත් මිනින්දෝරු එල්. ඒ. ද එස්. විජේතුංග විසින් සාදන ලද 1959 ඔක්තෝබර් මස 24 වන හා 25 වැනි දින අංක 4526/3 දරන පිඹුරේ නිරූපණය කරන ඇති ඉඩම් කොටසට උප බෙදීමක් වන) බලයලත් මිනින්දෝරු සී. පාලම්කුඹුර විසින් සාදන ලද 1985 පෙබරවාරි මස 09 වැනි දින සහ 1987 අගෝස්තු මස 5 වැනි දින අංක 4526/3 දරන පිඹුරේ ලොට් අංක 3B (රූ.1, පර්. 33) සහ ලොට් අංක 4B (අ.12, රූ. 2, පර්.35) ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූද, ඉහත කී අංක 4526/3 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර දහතුනයි පර්චස් විසි අටක් වූ (අ. 13, පර්. 28) බෙදා වෙන්කළ යාබද ඉඩම් කොටස් දෙක සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ. ඉහත කී ඉඩම් කොටස් දෙක (1990 ඔක්තෝබර් මස 11 වැනි දින පිටසන් කරන ලද බලයලත් මිනින්දෝරු සී. පාලම්කුඹුර විසින් සාදන ලද ඉහත කී අංක 4526/3 දරන පිඹුරේ ලොට් X හරහා යෑම ඒමේ (ලොට් අංක 4B සඳහා) මාර්ග අයිතිය සහ මහනුවර හඟුරන්කෙත මාර්ගයෙන් ප්‍රවේශය ද සමග) මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 308/267 දරන වෙළුමේ/ පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කොටස මෑතක දී සාදන ලද පිඹුරක පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත : එනම්,

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගංදහය කෝරළේ, ගෝනවත්ත සහ ගුරුදෙණිය ග්‍රාමයන්හි පිහිටා ඇත්තා වූ ද, "හරගම එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 2000 මාර්තු මස 26 වැනි දින අංක 9549 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූද,

ප්‍රමාණය අක්කර දහතුනයි පර්චස් විසි අටක් (අ. 13, පර්. 28)

ඉහත කී ලොට් අංක 1 දරන බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ.

2. (අ) ඉහත කී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගංදහය කෝරළේ, ගුරුදෙණිය උතුර හි පිහිටා ඇත්තා වූ ද: "හුරිගොල්ලහේන" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා (බලයලත් මිනින්දෝරු ජී. ආර්. ඩබ්ලිව්. එම්. වීරකෝන් විසින් සාදන ලද 1981 ජූලි මස 01 වැනි දින අංක 374 දරන පිඹුරේ ලොට් අංක 1 හි උප බෙදීමක් වන) බලයලත් මිනින්දෝරු සී. පාලම්කුඹුර විසින් සාදන ලද 1996 නොවැම්බර් මස 14 වැනි දින අංක 3447 දරන පිඹුරේ නිරූපණය කර ඇත්තා වූ ද, ඉහත කී අංක 3447 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම පහක් වූ ද(පර්. 7.5)

ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ. ඉහත කී ඉඩම් කොටස මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 289/285 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කොටස මැතකදී සාදන ලද පිඹුරක පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත ඃ එනම්,

ඉහත කී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගංදහය කෝරළේ, ගෝනවත්ත සහ ගුරුදෙණිය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, "හුරිගොල්ලහේන" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 2000 මාර්තු මස 26 වැනි දින අංක 9549 දරන පිඹුරේ ලොට් අංක 7 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද,

ප්‍රමාණය පර්චස් හතයි දශම පහක් වූ ද (පර්. 7.5)

ඉහත කී ලොට් අංක 7 දරන බෙදා වෙන්කළ ඉඩම් කෙටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ.

(ආ) ඉහත කී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගංදහය කෝරළේ, ගුරුදෙණිය උතුර හි පිහිටා ඇත්තා වූ ද, "හුරිගොල්ලහේන" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා (බලයලත් මිනින්දෝරු ජී. ආර්. ඩබ්ලිව්. එම්. වීරකෝන් විසින් සාදන ලද 1981 ජූලි මස 1 වැනි දින අංක 374 දරන පිඹුරේ ලොට් අංක 1 හි උප බෙදීමක් වන) බලයලත් මිනින්දෝරු සී පාලම් කුඹුර විසින් සාදන ලද 1998 ඔක්තෝබර් මස 24 වැනි දින අංක 3692 දරන පිඹුරේ නිරූපණය කර ඇත්තා වූ ද, ඉහත කී අංක 3692 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම පහක් වූ ද (පර්. 2.5) ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ සමග වේ.

ඉහත කී ඉඩම් කොටස මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 289/296 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කොටස මැතක දී සාදන ලද පිඹුරක පහත දැක්වෙන පරිදි විස්තර කර ඇතඃ එනම්,

ඉහත කී මධ්‍යම පළාතේ, මහනුරව දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගංදහය කෝරළේ, ගෝනවත්ත සහ ගුරුදෙණිය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූදඃ "හුරිගොල්ලහේන" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 2000 මාර්තු මස 26 වැනි දින අංක 9549 දරන පිඹුරේ ලොට් අංක 6 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූද,

ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම පහක් වූද (පර්. 2.5)
ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ.

3. ඉහත කී මධ්‍යම පළාතේ, මහනුරව දිස්ත්‍රික්කයේ, පාතහේවාවැට ගංදහය කෝරළේ, ගුරුදෙණියෙහි පිහිටා ඇත්තා වූ දඃ " කුරුඳුවත්ත එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 1999 අගෝස්තු මස 01 වැනි දින අංක 9265 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූදඃ ඉහත කී අංක 9265 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහතුනයි දශම පහක් වූ (රූ.1, පර්. 13.5) ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ. ඉහත කී ඉඩම් කොටස මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 372/116 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කොටස මැතක දී සාදන ලද පිඹුරක දැක්වෙන පරිදි විස්තර කර ඇතඃ එනම්,

ඉහත කී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට, ගංදහය කෝරළේ, ගෝනවත්ත සහ ගුරුදෙණිය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ දඃ "කුරුඳුවත්ත එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 2000 මාර්තු මස 26 වැනි දින අංක 9549 දරන පිඹුරේ ලොට් අංක 4 ලෙස ලකුණු කර නිරූපනය කර ඇත්තා වූ ද,

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් දහතුනයි දශම පහක් වූ ද (රූ.1, පර්. 13.5)

ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ.

4. ඉහත කී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගංදහය කෝරළේ, ගුරුදෙණිය උතුර හි පිහිටා ඇත්තා වූ දඃ "හුරිගොල්ලහේන" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 1999 අගෝස්තු මස 1 වැනි දින අංක 9266 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, ඉහත කී අංක 9266 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම හතක් වූ ද (පර්. 9.7) ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ. ඉහත කි ඉඩම් කොටස මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 372/117 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කොටස මැතක දී සාදන ලද පිඹුරක පහත දැක්වෙන පරිදි විස්තර කර ඇතඃ එනම්,

ඉහත කී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගංදහය කෝරළේ, ගෝනවත්ත සහ ගුරුදෙණිය ග්‍රාමයේ පිහිටා

ඇත්තා වූද: "හුරිගොල්ලහේන" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 2000 මාර්තු මස 26 වැනි දින අංක 9549 දරන පිඹුරේ ලොට් අංක 5 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද,

ප්‍රමාණය පර්චස් නවයයි දශම හතක් වූ ද (පර්.9.7)
ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ.

5. ඉහත කී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට, ගංදහය කෝරළේ, ගුරුදෙණියෙහි පිහිටා ඇත්තා වූ ද: " කුරුඳුවත්ත එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 1999 අගෝස්තු මස 1 වැනි දින අංක 9264 දරන පිඹුරේ අංක 1 ලෙස දක්වා ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, ඉහත කී අංක 9264 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හයක් වූ ද (රූ. 2, පර්.6) ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ සමග වේ. ඉහත කී ඉඩම් කොටස මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 373/130 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කොටස මෑතක දී සාදන ලද පිඹුරක පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත : එනම්,

ඉහත මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට, ගංදහය කෝරළේ, ගෝනවත්ත සහ ගුරුදෙණිය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද: "කුරුඳුවත්ත එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 2000 මාර්තු මස 26 වැනි දින අංක 9549 දරන පිඹුරේ ලෙට් අංක 3 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද,

ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හයක් වූ ද (රූ.2, පර්.6)

ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ.

6. (අ) ඉහත කී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගංදහය කෝරළේ, ගුරුදෙණියහි පිහිටා ඇත්තා වූ ද, "කුරුඳුවත්ත එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. එෆ්. එස්. ගුණසේකර විසින් සාදන ලද 1999 ජුනි මස 22 වැනි දින අංක 305 දරන පිඹුරේ ලොට් අංක 3A ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, ඉහත කී අංක 305 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනක් වූ ද (අ.1,රූ.3) ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ. ඉහත කී ඉඩම් කොටස මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 371/139 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

(ආ) ඉහත කී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගංදහය කෝරළේ, ගුරුදෙණියහි පිහිටා ඇත්තා වූ ද, "කුරුඳුවත්ත එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. එෆ්. එස්. ගුණසේකර විසින් සාදන ලද 1999 ජුනි මස 22 වැනි දින අංක 305 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, ඉහත කී අංක 305 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් එකයි වූ ද (අ.2,රූ.1) ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ. ඉහත කී ඉඩම් කොටස මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 371/139 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

(ඇ) ඉහත කී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගංදහය කෝරළේ, ගුරුදෙණියහි පිහිටා ඇත්තා වූ ද, " කුරුඳුවත්ත එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. එෆ්. එස්. ගුණසේකර විසින් සාදන ලද 1999 ජුනි මස 22 වැනි දින අංක 305 දරන පිඹුරේ ලොට් අංක 2A ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, ඉහත කී අංක 305 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනක් වූ ද (අ.1,රූ.3) ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ. ඉහත කී ඉඩම් කොටස මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 371/140 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී කොටස මෑතක දී සාදන ලද පිඹුරක පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත. එනම්

ඉහත කී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගංදහය කෝරළේ, ගෝනවත්ත සහ ගුරුදෙණියහි පිහිටා ඇත්තා වූ ද, "කුරුඳුවත්ත එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 2000 මාර්තු මස 26 වැනි දින අංක 9549 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද,

ප්‍රමාණය අක්කර පහයි රූඩ් තුනක් වූ ද (අ.5, රූ.3)
ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද සමග වේ.

උපකරණ, සමග විදුලි සැපයුම් පද්ධතිය, ජලපොම්ප, පයිප්ප සහ වෙනත් උපකරණ ඇතුලු ජල සැපයුම් පද්ධතිය, විදුලි සංදේශ උපකරණ, වායු සමීකරණ උපකරණ ඇතුලු මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති ඉහත කී ඉඩම් කොටසට සහ/ හෝ ඒ මත ඇති ගොඩනැගිලි දැනට හෝ ස්ථිරව

සවි කර ඇත්තා වූ හෝ මින්මතු කලින් කලට එකතු කරනු ලැබිය හැකි හෝ ස්ථිරව සවි කරනු ලැබිය හැකි වූ, එක්ව හා වෙන් වෙන් වශයෙන් වූ සියලු නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපකරණ, සවිතුරු, සවිකිරීම් ද සමග වේ.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය (බැංකුව) වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. එච්. එන්. අයි. සෙනෙවිරත්න මෙනවිය/මිය විසින් සහතික කරන ලද 2013.03.15 දින අංක 283 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කර පවරා දී ඇති සහ මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තරකර ඇති දේපළ සහ පරිශ්‍රය ඇපයට තබා එයට එරෙහිව ප්‍රදානය කරන ලද ණය මුදල්/පහසුකම් මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම (ණය ගැණුම්කරු වන) අංක 362, කොළඹ පාර. පැපිලියාන, බොරලැස්ග මුව යන ස්ථානයෙහි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තා වූ ද ලියාපදිංචි අංක පීවී 7580 දරන සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කර ඇති සමාගමක් වන දයා ඇපරල් එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් පැහැර හැර ඇති හෙයින් ද;

පහත විස්තර කර ඇති දේපළහි සහ පරිශ්‍රයෙහි සින්නක්කර අයිතිකරු වන (කලින් දයා කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලැබූ) ස්වකීය ලියාපදිංචි කාර්යාලය අංක 362, කොළඹ පාර, පැපිලියාන, බොරලැස්ගමුව යන ස්ථානයෙහි පිහිටා ඇත්තා වූ ද, ලියාපදිංචි අංක පීවී 9113 දරන සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කර ඇති සමාගමක් වන ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ඉහත කී අංක 283 දරන උකස් බැඳුම්කරය යටතේ ස්වකීය සින්නක්කර අයිතිය හිමිකම් සහ සම්බන්ධතාව බැංකුව වෙත උකස් කර ඇති හෙයින් ද; නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව.

උකස් කරන ලද දේපළ,
ලොට් අංක 1 (අ.13, පර්.28), ලොට් අංක 3 (රූ.2,පර්.6), ලොට් අංක 2 (අ.5, රූ.3)

**වර්ෂ 2024ක් වූ මාර්තු මස 25 වැනි දින පෙ.ව. 11.00ට**

දේපළ පිහිටි ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ වෙත පිවිසීම .-*

නුවර සිට මහියංගනය පාර ඔස්සේ තෙන්නේකුඹුර හංදිය දක්වා කිලෝමීටර් 4ක පමණ දුරක් ගමන් කර ඉන්පසු, හරගම පාරට දකුණට හැරී කිලෝමීටර් 4.5ක් පමණ ගමන් කර ඉන්පසු උදතැන්න පාරට *හෙවත්* ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත මඟ පෙන්වන පාරට වමට හැරී මීටර් 200ක් පමණ ගමන් කළ විට විෂයගත දේපළ පාර අවසානයේ ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.-*

විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනූව 90% ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය,
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1500/
(07) නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 3500/

*වෙනත් කරුණු සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න :*

කළමනාකරු මධ්‍යගත (අයකිරීම් අංශය),
නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.
අංක 40,
නවම් මාවත,
කොළඹ 02.
දුරකතන අංකය : 0112448448,

එල්. බී. සේනානායක
බලයලත් විනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු

අංක 7/1/10, 1 වන මහල, සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකතන අංකය : 011-2396520.

02 - 712

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - වේයන්ගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**නිට්ටඹුව, තිහාරිය, නාඹදළුව කට්ටොට පාරේ පිහිටි පර්චස් 20ක් විශාලැති අගනා ඉඩමක්.**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිහාරිය අංක. 318 දරන ග්‍රාම නිලධාරි වසමේ සියනෑ කෝරළේ උඩුගහ පත්තුවේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ නාඹදළුව පිහිටි "මල්වත්ත නාඹදළුව" නමැති ඉඩමට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ පී. පී. ජයසුන්දර විසින් 2020 නොවැම්බර් මස 07 වැනි දින වන දින සාදන ලද අංක. 3701 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක. 1A දරන ඉඩම් කැබැල්ල

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් 2022 අප්‍රේල් මස 8 වැනි දින සහතික කරන ලද අංක. 504 දරන හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ බැඳුම්කරයන් මත අයවිය යුතු මුදල් ගෙවීමට මොහොමඩ් උවයිස් මොහොමඩ් ෆාරස් ණයකරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත සඳහන් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ,

**වර්ෂ 2024 ක් වූ මාර්තු මස 20 වැනි දින පෙරවරු 10.00ට,**

අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර 2023.10.20 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* සහ 2023.11.03 වැනි දින "මව්බිම" "ඩේලි මිරර්" සහ "තිනක්කුරල්" පුවත්පත් බලන්න.

දේපළට ප්‍රවිශ්ඨවන මාර්ගය : නිට්ටඹුවේ සිට කොළඹ දෙසට කි.මී. 2 3/4 පමණ ගම්පොට පාර දක්වා ගමන් කර වමට හැරී කට්ටො පාරේ මීටර් 800ක් පමණ ඉදිරියට ගමන් කිරීමෙන් කට්ටොට පාර මුහුණ ලා පාරේ වම් පසින් අදාළ දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි :-

(01). ගැණුම් මුදලින් (10%)ක් ද,
(02). පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක්ද,
(03). වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද,
(04). සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද,
(05). ලිපිකරු හා සෝෂක ගාස්තු වශයෙන් රු. 2,000ක් ද,
(06). වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,500/-ක් ද, වේ.

ගැණුම් මිලේ ඉතිරි 90%ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් ගෙවීමට අපොහොසත්වුවහොත් ගෙවන ලද 10%ක මුදල ආපසු නොගෙවනු ලබන අතර දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

දේපළ පිළිබඳ වැඩි විස්තර දැනගැනීම පිණිස කොළඹ 10 ටී. බී. ජයා පාරේ වරිපනම් අංක. 479 දරන පරිශ්‍රයේ පිහිටි හැටන් නැෂනල් බැංකු පී එල් සී හි ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අයකිරීම් ගෙන් විමසන්න. දුරකතන අංක : 011 2661828 හෝ 0112 661866 අමතන්න.

පී. කේ. ඊ. සේනාපති
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු,

අංක 134, බැද්දගාන පාර,
කොට්ටේ.
දුරකතන අංක : 2873656, 011-2871184, 0777672082, 0777 449452.

02 - 715

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.